

සශ්‍රීකවත් ශ්‍රී ලංකාවක් බිහිකිරීම වෙනුවෙන්

# අනාගතය උදෙසා
# අපේ දැක්ම

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# හැඳින්වීම

ශ්‍රී ලංකාව එහි ප්‍රෞඪ අතීත සංස්කෘතිය සමඟ නවීන දැක්මක් සහිත අනාගතයක් කරා ගමන් කරමින් සිටින අතර කෘෂිකාර්මික ආර්ථික පදනමින් තරමක් බැහැරව යමින්, නිෂ්පාදන හා සේවා වැනි කාලීන අංශ කෙරෙහි නැඹුරුවෙමින් පවතින පසුබිමක් දක්නට ඇත. වරාය හා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වැඩිදියුණු කිරීම මඟින් යටිතල පහසුකම් දියුණු වීම ශ්‍රී ලාංකික ආර්ථිකයේ විකාශනය පිළිබිඹු කරයි. ලොව පිළිගත් උසස් අධ්‍යාපන ආයතන සමඟ ඇති සබඳතා සහ නව තාක්ෂණික සමාගම් බිහිවීම නිසා අධ්‍යාපන හා තාක්ෂණ යන අංශවල ද යම් තරමක වර්ධනයක් දක්නට හැකිය. එය අනාගත ලෝකයට ගැළපෙන තෘප්තිමත් ශ්‍රම බලකායක් නිර්මාණය වීම සඳහා ඉතා හිතකර තත්ත්වයකි.

කෙසේවෙතත් මෙම තත්ත්වයන් අප දැනට මුහුණ දෙමින් පවතින ගැටළු රාශියකින් යුත් යතාර්ථය වෙනස් නොකරනු ඇත. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වසර 2030 වන විට රජයේ අභිලාශය පරිදි සාර්ථක වීමට නම් ඒ වෙනුවෙන් ගත යුතු පියවර ගැනීම කඩිනම් කළ යුතුය. කාබනික කෘෂිකාර්මික භාවිතයන් කෙරෙහි යොමුවීම නිවැරදි තීරණයක් වුවත්, හිතකර ප්‍රතිඵල ගෙන එන ආකාරයෙන් එය ක්‍රියාත්මක කළ යුතුය.

සෞඛ්‍ය සංචාරක ක්ෂේත්‍රයට අවතීර්ණ වීම බලාපොරොත්තු තබාගත හැකි කරුණක් වුවත්, ගෝලීය මට්ටමෙන් තරඟකාරී වීමට නම් ඒ සඳහා සුදුසු උපාය මාර්ගික සැලසුම් මෙන්ම අවශ්‍ය ආයෝජනයන් තිබීමද අනිවාර්යය වේ.

පාරිසරික තිරසරතාවය හා ආර්ථික වර්ධනය අතර සමතුලිතතාවය පවත්වා ගැනීමට සමාජය අනුගත කිරීම විශාල අභියෝගයකි. ශ්‍රී ලංකා වාසීන්ට සෑමවිටම අවශ්‍ය වන්නේ නිවැරදි ප්‍රතිපත්ති සහිත ස්ථාවර රාජ්‍ය පාලන තන්ත්‍රයකි. පසුගිය දශක කිහිපය තුළ පැවති පාලන ව්‍යූහයන් කිහිපයක්ම ඔවුන් අපේක්ෂා කළ තත්ත්වයන් සාක්ෂාත් කරගැනීමට අපොහොසත් වීම නිසාවෙන් ජනතා අප්‍රසාදයට පාත්‍රවිය. එලෙස අපොහොසත් නොවී ක්‍රියාත්මක වීමට නම් ක්‍රියාකාරී ආර්ථික ප්‍රතිපත්ති හා මනා ප්‍රවේශයක් නායකත්වය විසින් ඇති කරගත යුතුය.

# ජන බල සටන

## ශක්තිමත් රාජ්‍යයක් ගොඩනැඟීම උදෙසා පුරෝගාමී පරිවර්තනය

සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් ගොඩනැඟීම සඳහා වන, "ජන බල සටන" දැක්ම යටතේ පරිවර්තනීය වෙනසක් ඇති කිරීමට අපි පෙරමුණ ගෙන සිටින්නෙමු. ඒ සඳහා අභියෝග නිසිලෙස ජයගත හැකි විශේෂඥ දැනුමක් ඇති වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් නායකත්වයක් අත්‍යාවශ්‍ය බව අපි තරයේ විශ්වාස කරන්නෙමු. අපගේ මෙහෙවර දීප්තිමත් අනාගතයක් කරා ගමන් කිරීමට රාජ්‍යයේ අවශ්‍යතා ප්‍රමුඛ කොටගත් පාලනයක් බිහිකිරීමයි.

### අපගේ ප්‍රවේශය

නවීන ලෝකයේ අභියෝග සාර්ථක ලෙස ජය ගැනීමට නම් දක්ෂ මෙන්ම කාර්යක්ෂම නායකයන් අවශ්‍ය වන බව අපගේ විශ්වාසයයි. සාම්ප්‍රදායික දේශපාලන රටාවන්ගෙන් බැහැරව නීති ක්ෂේත්‍රය, වෛද්‍ය, ඉංජිනේරු හා මානව සංවර්ධන ආදී තවත් බොහෝ වෘත්තීය පසුබිම් වලින් ඉතා ක්‍රමානුකූලව තෝරාගත් අපේක්ෂකයන් රැසකගෙන් "ජන බල සටන" ශක්තිමත් වී ඇත. රටෙහි සියලු අංශ ආවරණය වන මනා පාලනයක් ඇතිකිරීම සඳහා මෙම වෘත්තීය විවිධත්වය මනා පිටිවහලක් වන බව අපි සහතික කරන්නෙමු.

### පාර්ලිමේන්තුව සවිබල ගැන්වීම

පාර්ලිමේන්තුව, රටක අනාගතය හා පැවැත්ම පිළිබඳ තීරණ ගැනීමේ ප්‍රධානතම සාධකය වන අතර එහි දී ගනු ලබන තීරණ වඩා යහපත් වීමට නම්, මහජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරීපත් වීමට බලාපොරොත්තු වන අපේක්ෂකයන් අදාළ ක්ෂේත්‍රයන්හී ප්‍රවීණයන් වීම ම පමණක් ප්‍රමාණවත් නොවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුල ඇති සියුම් කරුණු පිළිබඳ ඇති අවබෝධය, සමස්ත පාර්ලිමේන්තු ක්‍රියාවලිය හා රටේ නීතිය පිළිබඳ මනා දැනුමකින්ද ඔවුන් සන්නද්ධ විය යුතු බව අපගේ විශ්වාසයයි. ප්‍රගතිශීලී තීරණ ගැනීමත්, අවශ්‍යම අවස්ථාවේදී එම තීරණ ක්‍රියාත්මක කිරීමත් ඉහත ගුණාංග මගින් වඩාත් ශක්තිමත් වනු ඇත.

### ජීවනෝපාය ඉහළ නැංවීම හා රැකියා උත්පාදනය සඳහා වූ අපේ දැක්ම

පවතින ගෝලීය ආර්ථික අපහසුතා වලට සාර්ථකව මුහුණදීමට නම් මූල්‍යමය වශයෙන් ශක්තිමත් පුරවැසියන් බිහිවිය යුතු බව නොරහසකි. ඒ සඳහා ඉහළ වැටුප් සහිත ගුණාත්මක රැකියා උත්පාදනය වීමත්, ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ නිපුණතා වලින් පරිපූර්ණ වූත් තෘප්තිමත් ශ්‍රම බලකායක් අප සතුව තිබීමත් අනිවාර්යය වේ. නවෝත්පාදනය හා ව්‍යවසායකත්වය දිරිමත් කිරීම හරහා ශ්‍රී ලාංකීය තාරුණ්‍යය පෙරටු කරගත්, මුළුමහත් සමාජයම සමෘද්ධිමත් කරනු ලබන රැකියා රැසක් උත්පාදනය කිරීම අපේ මූලික අභිප්‍රායකි. රටේ සමස්ත ප්‍රගතියට දායකවිය හැකි ප්‍රබල වත්කමක් ලෙස පුරවැසියන් සතු හැකියාවන් සහ දැනුම භාවිතා කළ හැකි බව අපි විශ්වාස කරන්නෙමු.




# ජාතික ආරක්ෂාව තහවුරු කිරීම

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# ජාතික ආරක්ෂාව තහවුරු කිරීම

ලෝකය සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින පසුබිමක ජාතික ආරක්ෂාව යනු රජයක් සතු ප්‍රබල වගකීමකි. "ජන බල සටන" අපගේ ප්‍රවේශයේ මූලික හරය වන්නේ ජාතික ආරක්ෂාව හුදු ආරක්ෂා කිරීමෙන් පමණක් නොනැවතී මනා ඒකාග්‍රතාවයකින් පවත්වාගෙන යාමට අවශ්‍ය නවීකරණය පිළිබඳ අවධානය යොමු කිරීමයි. නවීන අභියෝගවලට මුහුණදීමට ශ්‍රී ලංකාව තාක්ෂණිකව සන්නද්ධ විය යුතු අතර එවැනි අභියෝග වලට ඔරොත්තු දෙන ක්‍රියාශීලී ආරක්ෂිත පිළිවෙතක් වෙනුවෙන් අපි පහත යෝජනා ඉදිරිපත් කරන්නෙමු.

- බුද්ධි අංශ නිලධාරීන් දේශපාලන මැදිහත්වීම් වලින් ආරක්ෂා කිරීම වෙනුවෙන් අවශ්‍ය නීති ක්‍රියාත්මක කිරීම සහ වෘත්තිකයන් ලෙස ඔවුන් දක්වන දක්ෂතා වලට සරිලන මනා වැටුප් ක්‍රමවේද හඳුන්වාදීම මඟින් ඔවුන් දිරිමත් කිරීම.

- ගෝලීය වශයෙන් කෙරෙන නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් වල මර්මස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව පත්වීම වැළැක්වීම සඳහා මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධවලට එරෙහිව විශේෂිත ආරක්ෂක ඒකකයක් පිහිටුවීම.

- ඩිජිටල් ජෛවමිතික තාක්ෂණය (DIGITAL BIOMETRIC TECHNOLOGY) භාවිතයෙන් වඩා කාර්යක්ෂමව ආරක්ෂිත මෙහෙයුම් කරගෙන යාමට අවශ්‍ය පහසුකම් ලබාදීම මඟින් පොලීසිය සතු බලය වැඩි කිරීම.

- අපගේ ආරක්ෂක හමුදාවන්ට උසස් පුහුණුවක් සහ නවීන උපකරණ ලබාදීම මඟින් අපගේ හමුදා සහ පොලිස් වෘත්තීන් සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමෙන්, ඕනෑම අභියෝගයකට මුහුණ දීමට ඔවුන් සූදානම් කළ යුතුය.

- ආරක්ෂක හමුදා සහ ප්‍රාදේශීය ප්‍රජාවන් අතර ශක්තිමත් සබඳතා ගොඩනඟා ගැනීමෙන්, අපරාධ සහ ත්‍රස්තවාදයට එරෙහිව ඒකාබද්ධ පෙරමුණක් නිර්මාණය කරමින් සහයෝගීතාව සහ විශ්වාසය දිරිමත් කිරීමට කටයුතු කළ යුතුය.

- කලාපීය ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර වශයෙන් ඇතිවිය හැකි තර්ජන විසඳීමට, බුද්ධි තොරතුරු සහ සම්පත් බෙදා ගැනීමට අපි අසල්වැසි රටවල් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය.



# පාර්ලිමේන්තුවේ කාර්යයභාරය සවිමත් කිරීම

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# පාර්ලිමේන්තුවේ කාර්යයභාරය සවිමත් කිරීම

රාජ්‍යය ප්‍රතිපත්ති සම්පාදනයේදී මෙන්ම ආණ්ඩුකරණයෙහිදී ද තීරණාත්මකම සාධකයක් වන්නේ ගරු පාර්ලිමේන්තුවයි. වගවීමක් ඇති,ඵලදායී මෙන්ම විනිවිදභාවයක් ඇති දේශපාලන වේදිකාවක් නිර්මාණය කරගැනීමට අවශ්‍ය බලය විශේෂයෙන්ම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සතුය. පාර්ලිමේන්තු කාර්යයභාරය සවිබලගැන්වීම තුළින් රාජ්‍යයට ප්‍රගතියක් අත්කරදීම සඳහා අපි විසින් පහත යෝජනා ඉදිරිපත් කරන්නෙමු.

- නීති, විගණන ආදී ක්ෂේත්‍රවල විශේෂඥයන්ගෙන් සමන්විත සහිත ස්වාධීන උපදේශක කවුන්සිලයක් මඟින් ජනාධිපති, අගමැති ධූරවල සහ සියලුම අමාත්‍යාංශවල තීරණ ගැනීම හා ඒවා සමාලෝචනය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

- පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල අයවැය, මධ්‍යම රජයේ අයවැය මත රඳාපැවතීම අඩු කිරීම මෙන්ම ගරු පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල නියෝජිතයන් ගණන අඩු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.

- වසර 18 කින් පමණ සංශෝධනයට ලක් නොවූ අමාත්‍යාංශ වැටුප් ව්‍යුහය වෙනුවට නව වැටුප් ව්‍යුහයක් හඳුන්වාදීම. මෙම ප්‍රතිසංස්කරණයේ අරමුණ වන්නේ අමාත්‍යවරුන්ගේ කාර්යය සාධනය ඉහළ දැමීම සහ පද්ධතිය දූෂණය වීමට ඇති අවස්ථාව අඩුකිරීමයි. අමාත්‍යවරුන්ගේ කුසලතා මත පදනම්ව ඒවා ඇගයීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම මඟින් මහජන සේවය සඳහා කැපවීම දිරිමත් කරවීම.

- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය ක්‍රියාත්මක කිරීම මඟින් ජාතික සමඟිය ඇති කිරීම සහ දිගුකාලීන වාර්ගික හා කලාපීය අර්බුද විසඳීමට අවශ්‍ය පියවර ගැනීම.

- පාර්ලිමේන්තු කටයුතු සම්පූර්ණයෙන්ම විනිවිද විය යුතුය. මහජන නියෝජිතයින්ගේ ක්‍රියාකලාපය සහ තීරණ ආදිය ජනගත කිරීම සඳහා සජීවී විකාශයන් සහ ඡන්ද සහ විවාද වාර්තා ප්‍රසිද්ධියට පත් කළ යුතුය.

- සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ආචාරධර්ම පද්ධති බලාත්මක කිරීම. පාර්ලිමේන්තු ආචාර ධර්ම කඩකිරීම් අධීක්ෂණය කිරීමට සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පුළුල් ආචාර ධර්ම පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ ඒවා නියාමනය කිරීමට ස්වාධීන ආයතනයක් පිහිටුවීම.

කාර්යක්ෂම සහ කාලෝචිත නීති සම්පාදනය සහතික කිරීම සඳහා ව්‍යවස්ථාදායක ක්‍රියාවලීන් විධිමත් කිරීම. නිලධාරිවාදී ප්‍රමාදයන් අවම කිරීමට සහ පාර්ලිමේන්තු මෙහෙයුම්වල සඵලතාවය වැඩි දියුණු කිරීමට අදාළ භාවිතයන් සහ තාක්ෂණය හඳුන්වාදීම.

සැබෑ ලෙසම සියලුම ශ්‍රී ලාංකිකයන් නියෝජනය වන පාර්ලිමේන්තුවක් නිර්මාණය කිරීම අපේ වගකීමයි. ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය තුළ කාන්තාවන්, තරුණයන් සහ ආන්තික ප්‍රජාවන්ගේ වැඩි සහභාගිත්වය දිරිමත් වන අන්දමින් ප්‍රතිපත්ති සම්පාදනය විය යුතුය.

ජනතා නියෝජිතයින් සහ ජනතාව අතර නිරන්තර සන්නිවේදනය සඳහා වේදිකා පිහිටුවීම සහ පුරවැසියන්ගේ හඬට සවන් දීම සහතික කිරීම සඳහා රැස්වීම්, ඩිජිටල් සන්නිවේදන නාලිකා සහ ප්‍රවේශ විය හැකි කාර්යාල ස්ථාපනය කළ යුතුය.

කාලීන අවශ්‍යතා සපුරාලීම සඳහා පාර්ලිමේන්තු ක්‍රියා පටිපාටි, නීති රීති සහ ව්‍යුහයන් සමාලෝචනය කර අවශ්‍ය අවස්ථාවන් හිදී ඒවා යාවත්කාලීන කළ යුතුය.



# අධිකරණ ක්‍රියාවලිය විධිමත් කිරීම

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# අධිකරණ ක්‍රියාවලිය විධිමත් කිරීම

විශ්වාසනීය වූත් කාර්යක්ෂම වූත් අධිකරණ පද්ධතියක් යනු ප්‍රජාතන්ත්‍රවාදයේ අනිවාර්යය අංගයකි. නීතිය සැමට එකලෙස ක්‍රියාත්මක වන සර්ව සාධාරණ අධිකරණ පද්ධතියක් වෙනුවෙන් පහත යෝජනා අප විසින් ඉදිරිපත් කරන්නෙමු.

- දැනට අධිකරණ පද්ධතිය හරහා සිදුවන කාර්යයභාරය වඩා හොඳින් කලමණාකරණය කිරීම සඳහා අවශ්‍යතාවය මත පදනම්ව සුදුසුකම් ලත් නව අධිකරණ කාර්යය මණ්ඩල සාමාජිකයන් බඳවාගැනීම කළ යුතුය.

- අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන බවටත්, අධිකරණයට කිසිදු ආකාරයක බලපෑමක් සිදු නොකරන බවටත් අපි පොරොන්දු වන්නෙමු. සාධාරණ හා අපක්ෂපාතී අධිකරණ පද්ධතියක් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අඩිතාලම වන අතර, අපි එය නොසැලී ආරක්ෂා කරන්නෙමු.

- මහජන විශ්වාසය සඳහා විනිවිදභාවය සහ වගවීම ඉතා වැදගත් වේ. විනිශ්චයකාරවරුන් සහ නීති වෘත්තිකයන් ඔවුන්ගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් වගකිව යුතු යාන්ත්‍රණයන් සමඟ අධිකරණ ක්‍රියාදාමය තුළ විවෘතභාවය සහ විනිවිදභාවය සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අපි ක්‍රියාත්මක කරන්නෙමු.

- නඩු අනවශ්‍ය ලෙස කල්යෑම අවම කිරීමට සහ අධිකරණ ක්‍රියාවලිය කඩිනම් කිරීමටත් අධිකරණ පද්ධතිය නවීකරණය කිරීම සහ නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් යුක්තිය පසිඳලීම කඩිනම් හා විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු අපි සම්පාදනය කරන්නෙමු.

- විනිසුරුවරුන් සහ නීති වෘත්තිකයන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයක් ලබාදීමට අවශ්‍ය භාවිතයන් හා දැනුම පිළිබඳව ඔවුන් යාවත්කාලීනව තබා ගැනීමට උසස් පුහුණු වැඩසටහන් ස්ථාපිත කරන්නෙමු.

- සමාජ-ආර්ථික තත්ත්වය කුමක් වුවත් නීතිය සෑම කෙනෙකුටම සමාන විය යුතුය. නීති ආධාර සේවා පුළුල් කරන අතර සියලුම පුරවැසියන්ට නීතිමය සහන ලබාගැනීමට ඇති අවස්ථාව හා නීතිය පිළිබඳව පොදු ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්නෙමු. අපගේ නීති පද්ධතිය සියලු පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන බවටත්, ආන්තික සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් සඳහා යුක්තිය ප්‍රවර්ධනය කරන බවටත් අපි සහතික වෙමු.

- අධිකරණ අමාත්‍යාංශය සතු යටිතල පහසුකම් නවීකරණය කිරීමට සහ ඩිජිටල්කරණය කිරීමට අවශ්‍ය ආයෝජනයන් අපි ශක්තිමත් කරන්නෙමු. කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා දත්ත කළමනාකරණ පද්ධති හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතය වැඩි කිරීම වැනි ප්‍රවේශයන් මෙයට ඇතුළත් වේ.




# මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය

# මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම

මැතිවරණයක් යනු පුරවැසියන්ගේ සාමූහික ප්‍රජාතන්ත්‍රවාදී හඬ නියෝජනය කරන ශක්තිමත් ගොඩනැඟිල්ලක මුල්ගල වැනි අංගයකි. කාර්යක්ෂම වූත්, විනිවිදභාවයෙන් යුක්ත වූත් සාධාරණ මැතිවරණයක් පැවැත්වීම අතිශය තීරණාත්මක සහ භාරදූර කාර්යයකි. මේ ඒ සඳහා "ජන බල සටන" අපේ ප්‍රවේශයයි.

## කාර්යක්ෂම මැතිවරණ ක්‍රියාවලිය

මැතිවරණයක් පැවැත්වීම සඳහා මැතිවරණ කොමිසමට ගතවන කාලය හා ඒ සඳහා වන වියදම් ආදිය විධිමත්ව අධීක්ෂණය කිරීමත්, මධ්‍යම රාත්‍රියට පෙර මැතිවරණ ප්‍රතිඵල නිකුත් කිරීම වැනි මූලික පියවර ගැනීම. ඊට අමතරව අනවශ්‍ය ලෙස දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම අධෛර්යමත් කිරීම මඟින් මැතිවරණ පත්‍රිකා මුද්‍රණයට වැයවන මුදල් ඉතිරි කිරීම සහ ඡන්දය ප්‍රකාශ කරන අවස්ථාවේදී ඡන්ද දායකයින් අනවශ්‍ය ලෙස ව්‍යාකූලත්වයට පත්වීම අවම කිරීමට පියවර ගැනීම.

## සමානුපාතික නියෝජන ක්‍රමය අහෝසි කිරීම

සමානුපාතික නියෝජන ක්‍රමය අවලංගු කොට ඒ වෙනුවට සරල වූත් ඍජු මැතිවරණ ක්‍රමයක් යෝජනා කරන අතර එමඟින් රාජ්‍ය පාලන ව්‍යූහයට, අවංක සහ මහජන සේවයට කැපවීමක් ඇති අපේක්ෂකයන් ඉදිරිපත් වීම දිරිමත් කිරීම.

## නව තාක්ෂණය භාවිතයෙන් සාධාරණ මැතිවරණ පැවැත්වීම

මුළු ලෝකයම ඩිජිටල්කරණය වෙමින් පවතින අවධියක නවීන තාක්ෂණය මැතිවරණ ක්‍රියාවලිය කෙරෙහි භාවිතා කිරීම අත්‍යාවශ්‍ය කරුණක් ලෙස අපි විශ්වාස කරමු. ඡන්ද දායකයන් ලියාපදිංචි කිරීමේ සිට, ඩිජිටල් ඡන්ද විමසීමක් මඟින් ඡන්දය ප්‍රකාශ කිරීම දක්වා නව තාක්ෂණය භාවිතා කිරීම මඟින් වඩා නිරවද්‍ය වූ ආරක්ෂිත මැතිවරණයක් පැවැත්වීමට අදාළ පියවර ගැනීම.

තවද,

- ප්‍රචාරණ වියදම් ප්‍රසිද්ධ කිරීම පිළිබඳ දැඩි රෙගුලාසි බලාත්මක කළ යුතුය. මැතිවරණ ක්‍රියාවලියේ දූෂණ හා අනිසි බලපෑම් වැලැක්වීම සඳහා සියලු දේශපාලන පක්ෂවල වියදම් හෙළිදරව් කිරීම අනිවාර්ය කළ යුතුය.

- මැතිවරණ සඳහා නිදහස් හා සාධාරණ මාධ්‍ය ආවරණය සහතික කළ යුතුය. සියලුම දේශපාලන පක්ෂවලට මාධ්‍ය වේදිකාවලට සමාන අවස්ථාවක් ලැබිය යුතු බවත් මැතිවරණ පුවත් ආදිය වාර්තාකරණය කිරීම අපක්ෂපාතී සහ සාධාරණ විය යුතු බව අපි අවධාරණය කරමු.

- ගෝලීය භාවිතයන් හා නියමිත ප්‍රමිතීන්ට අනුකූලව මැතිවරණ නීති සමාලෝචනය කර යාවත්කාලීන කිරීම අවශ්‍යතාවයක් ලෙස අපි දකිමු. පවතින මැතිවරණ ක්‍රමයේ යම් අඩුපාඩුවක් හෝ දුර්වලතා ඇත්නම් ඒවා විසඳීමට නීතිමය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අනිවාර්යයෙන් කළ යුතුය.

- පශ්චාත් මැතිවරණ වගවීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණ ස්ථාපිත කිරීම තුළින් විෂමාචාර හෝ අක්‍රමිකතා පිළිබඳ ඕනෑම චෝදනාවක් කඩිනමින් සහ විනිවිදභාවයෙන් විමර්ශනය කර ඒවාට විසඳුම් ලබා දීම අපි සහතික කරන්නෙමු.



# දූෂණ පිටුදැකීමේ සැලසුම

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

## දූෂණ පිටුදැකීමේ සැලසුම

අප අද වන විට අත්විඳින නොයෙකුත් ආර්ථික අපහසුතා වලට මූලික හේතුව ලෙස දිගු කාලයක පටන් රටේ සිදුවන දූෂණ හා අක්‍රමිකතා දැක්විය හැකිය. නීති විරෝධී ලෙස රටින් පිටතට ගලා යන විශාල මුදල් ප්‍රමාණයන් හා මහජන මුදල් කෝටි ගණනින් අවභාවිත වීම් නිතර දක්නට ලැබේ. ආර්ථික හානියට අමතරව ජනතාව දේශපාලන නියෝජිතයින් කෙරෙහි ඇති විශ්වාසය පළුදු වීමටද මේ දූෂණ හේතු වී ඇත. වගවීම සහ මහජන විශ්වාසය යළි ගොඩනැගීමටත්, දූෂණ වලට එරෙහිව ක්‍රියාකාරී විය යුතු ආකාරයත් පිළිබඳ පැහැදිළි ප්‍රවේශයක් සැපයීම අපගේ අරමුණයි.

### ගැටළුව හඳුනාගැනීම

වසර 2009 -2018 දක්වා කාලය තුළ නීතිවිරෝධී ආකාරයෙන් මෙරටින් පිටට ඇදී ගිය මුදල් ප්‍රමාණය ඇ.ඩො. බිලියන 41.5කි. 2022 වනවිට ශ්‍රී ලංකාවේ සමස්ත විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො. බිලියන 51ක් වීමත්, එම ණය ආපසු නොගෙවීම හේතුවෙන් ජාත්‍යන්තරය හමුවේ රට බංකොළොත් භාවයට පත් වීමටත්, විවිධාකාරයේ ආර්ථික අර්බුද වලට මුහුණදීමටත්, මෙවැනි නීතිවිරෝධී මූල්‍ය ගලනයන් හේතු වී ඇත.

### සිද්ධි අධ්‍යනය - සිංගප්පූරුව හා සංසන්දනය

2022 වන විට ශ්‍රී ලංකාවේ සමස්ත විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො. බිලියන 51ක් වූ බව අපි දනිමු. නමුත් අප වැනිම ආසියානු කලාපීය රටක් වන සිංගප්පූරුව මේ වන විට ඇ.ඩො. බිලියන 2000 ක විදෙස් ණය සීමාවට ආසන්න වී ඇති පසුබිමක ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්ති හා පාලන ප්‍රතිපත්ති, අපට සාපේක්ෂව ආයෝජන විශ්වාසය ඉහළ මට්ටමක පවතී.

### යෝජිත පියවර

- 20 වන සංශෝධනය අහෝසි කර, 19 වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් ලබා දුන් ප්‍රතිසංස්කරණ නැවත ස්ථාපනය කිරීම.
- විධායක ජනාධිපති ධූරය අහෝසි කර පාර්ලිමේන්තුවට වග කියන අග්‍රාමාත්‍ය වරයෙකු යටතේ පාලනය වන කැබිනට් මණ්ඩලයකට බලය පැවරීම.
- මහජන මුදල් අවභාවිතය වැළැක්වීම සඳහා පිහිටුවා ඇති පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාව, රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව සහ රාජ්‍ය මූල්‍ය පිළිබඳ කාරක සභාව වැනි ආයතන මඟින් අනාවරණය කරගන්නා පුද්ගලයින්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම. (COPE, COPA, COPF)

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana



# මූල්‍ය අංශය සවිමත් කිරීම

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# මූල්‍ය අංශය සවිමත් කිරීම

මූල්‍ය ක්ෂේත්‍රය තුළ මූලික වශයෙන් රජය සතු ව්‍යවසාය, මහ බැංකුව සහ ප්‍රසම්පාදන ප්‍රතිපත්ති කෙරෙහි අපි අපේ අවධානය යොමු කරන්නෙමු. අපගේ ඉලක්කය වන්නේ ගෝලීය තරඟකාරිත්වය පවත්වා ගනිමින් ජාතියේ අවශ්‍යතා වඩාත් හොඳින් ඉටු කරන විනිවිද පෙනෙන සහ තිරසාර මූල්‍ය පද්ධතියක් ශ්‍රී ලංකාව තුළ බිහිකිරීමයි.

## රාජ්‍ය ව්‍යවසාය

ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වය සහ දිගුකාලීන තිරසාරභාවය රඳා පවතින්නේ ශක්තිමත් ප්‍රතිපත්ති ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීම සහ පාර්ලිමේන්තු අධීක්ෂණය මත ය. රජය සතු ව්‍යවසායන් මෙහිදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. වගවීම සහ තිරසාර බව කෙරෙහි අවධානය යොමු කරමින් පහත කරුණු සැලකිල්ලට ගෙන දැනට පාඩු ලබන රජය සතු ව්‍යවසායන් ලාභදායී ව්‍යාපාර බවට පත් කළ හැකිය.

- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් රාජ්‍ය මුදල් මත පැටවෙන බර අඩු වන අතර එමඟින් රාජ්‍ය ව්‍යාපාර වෙත අත්‍යවශ්‍ය ආයෝජන සම්පාදනය කළ හැකිය.
- කුසලතා මත පදනම් වූ ක්‍රියාවලීන් හරහා තෝරාගත් වෘත්තිකයන්ගෙන් සමන්විත අධීක්ෂණ කමිටු පත් කිරීම මඟින් කාර්යක්ෂම කළමනාකරණය සහතික කළ හැකිය.
- විමධ්‍යගත කිරීම සහ වෙළඳපල පදනම් වූ මිලකරණය තුළින් රාජ්‍ය ව්‍යවසායන් තුළ ඇති අකාර්යක්ෂමතා සහ දූෂණ අවම කළ හැකිය.

## මහ බැංකුව

රටේ මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම, ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සහ ආර්ථිකය වර්ධනය කිරීම සඳහා මහ බැංකුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. අපගේ සැලැස්ම මහ බැංකුවේ ස්වාධීනත්වය ආරක්ෂා කරමින් එහි විශ්වසනීයත්වය සහතික කිරීමට කටයුතු කිරීමයි. මූල්‍ය ප්‍රතිපත්තිවල ඵලදායීතාවය ඉහළ නැංවීමෙන් තිරසාර ආර්ථික සංවර්ධනයට සහය වීම සහ මූල්‍ය ස්ථායිතාව පවත්වා ගැනීම අපගේ අරමුණයි.

- මූල්‍ය ප්‍රතිපත්ති ස්වාධීනව ක්‍රියාත්මක කිරීමට මහ බැංකුවට ස්වයං පාලනයක් ලබා දීම ඉතා වැදගත් වේ. ස්වාධීනත්වය නොමැතිකම නිසා ආර්ථික ස්ථාවරත්වයට හානි කරන මුදල් අධික ලෙස මුද්‍රණය කිරීම වැනි දුර්වල මූල්‍ය තීරණ මෙමඟින් නතර කළ හැක.
- අපේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ප්‍රේෂණ සඳහා නිල නාලිකා භාවිතා කිරීමට විදේශගත ශ්‍රී ලාංකිකයන් දිරිමත් කිරීමට මහ බැංකුව කටයුතු කළ යුතුය. විදේශ මුදල් තැන්පතු සඳහා වාරික පොලී අනුපාත, විශේෂ නිවාස ණය සහ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම මගින් මෙය සාක්ෂාත් කර ගත හැකි අතර, අවිධිමත් මුදල් හුවමාරු මාර්ග මගින් උග්‍ර වූ විදේශ විනිමය අර්බුදය මේ හරහා සමනය කළ හැකිය.
- අවම වශයෙන් මාස තුනක ආනයන ආවරණය වන පරිදි විදේශ විනිමය සංචිත පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙය ආර්ථික අවිනිශ්චිතතාවයන්ට එරෙහිව ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් වන අතර විනිමය අනුපාතය ස්ථාවර කිරීමට උපකාරී වේ.

- රජය විසින් අධික ලෙස බාහිර ණය ගැනීම් පිළිබඳව සොයා බැලීම ඉතා වැදගත් වේ. ණය ගැනීම් සාධාරණ ප්‍රතිලාභ ලබා දෙන බවටත් ප්‍රමාණවත් විදේශ විනිමය ඉපැයීමෙන් හෝ මුදල් ඉතිරි කර ගැනීම මඟින් ණය ගෙවීමට හැකියාව ඇති බවටත් මහ බැංකුව සහතික විය යුතුය.
- වැට් බදු අඩු කිරීම සහ පුද්ගලික බදු කප්පාදුව වැනි සංස්කරණ රාජ්‍ය ආදායම පහත වැටීමට හේතු විය. රජය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින්, ජනතාව මත අධික බරක් පැටවීමකින් තොරව, මූල්‍ය තිරසාරත්වය පවත්වාගෙන යන සමතුලිත බදු ක්‍රමයක් ඇති කළ යුතුය.

## ප්‍රසම්පාදන ප්‍රතිපත්ති

තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම, වටිනාකම සහතික කිරීම සහ දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා විනිවිදභාවයෙන් යුත් සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන පිළිවෙත් අත්‍යවශ්‍ය වේ. අපගේ සැලැස්ම රාජ්‍ය වියදම්වල විනිවිදභාවය, වගවීම සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ප්‍රසම්පාදන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. ප්‍රසම්පාදන ක්‍රියාවලීන් විධිමත් කිරීම සහ සැපයුම්කරුවන් අතර සාධාරණ තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම අපගේ අරමුණයි. මෙය අවසානයේ තරඟකාරී මිල ගණන් යටතේ වඩා හොඳ තත්ත්වයේ භාණ්ඩ හා සේවා ලබා දෙනු ඇත.

මූල්‍ය අංශයේ මෙම තීරණාත්මක අංග තුන ශක්තිමත් කිරීම තුළින් අපේ ආර්ථික සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම අපගේ අරමුණයි. විනිවිදභාවයෙන් යුතු පරිචයන් සහ උපායමාර්ගික මුලපිරීම් හරහා පුරවැසියන්ගේ සමෘද්ධිය සහ යහපැවැත්ම වැඩි දියුණු කරමින් ආයෝජන සහ නවෝත්පාදන ඇතුළත් සංවර්ධනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට උත්සාහ කරමු.




# විදේශීය ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තරය

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# විදේශීය ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තරය

අපගේ විදේශ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවට කල්පවත්නා ප්‍රගතියක් සහ සෞභාග්‍යයක් ගෙන ඒම සඳහා ලොව පුරා රටවල් සමඟ ශක්තිමත් හවුල්කාරිත්වයක් ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කරයි. ශ්‍රී ලංකාව තුළ තිරසාර ප්‍රගතිය සහ සමෘද්ධිය ළඟා කර ගැනීම සඳහා ජාත්‍යන්තර මිත්‍ර රටවල් සමඟ සහයෝගීව කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව අපි පිළිගනිමු. විවිධ දේශපාලනික, ආර්ථික සහ සංස්කෘතික පසුබිම් සහිත රටවල් සමඟ දේශසීමා ඉක්මවා යන සහයෝගී ජාලයක් නිර්මාණය කිරීම අපගේ අරමුණයි. මීට අමතරව පහත සැලසුම් අපි යෝජනා කරන්නෙමු.

## විදේශීය රැකියා සහ ආයෝජන

සියළු රටවල් වල පිහිටා ඇති ශ්‍රී ලාංකික තානාපති කාර්යාල හරහා විදේශ රැකියා සඳ හා පුහුණු සහ අර්ධ පුහුණු ශ්‍රමිකයන් සම්බන්ධ කිරීමට අවශ්‍ය ප්‍රවර්ධනයන් සිදු කිරීම. ඒ හා සමගාමීව විදේශ ආයෝජන ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමටත් අපි කටයුතු කරන්නෙමු. අපගේ රාජ්‍ය තාන්ත්‍රික බළකාය ශක්තිමත් කිරීමෙන් සහ ලොව පුරා රටවල් සමඟ ධනාත්මක සබඳතා වර්ධනය කිරීමෙන්, ලෝකය හමුවේ ශ්‍රී ලංකාවේ ස්ථාවරය ඉහළ නංවන්නෙමු.

## අර්බුද කළමනාකරණය

ආහාර හෝ ඖෂධ හිඟ හෝ වෙනත් එවැනි අර්බුදවලදී අපගේ තානාපති කාර්යාල වලට තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ හැක. ශ්‍රී ලංකාවට ඉතා ඉක්මනින් සහ කාර්යක්ෂමව අත්‍යවශ්‍ය සැපයුම් ලබා දීමට අවශ්‍ය සම්බන්ධීකරණයන් සපයා ගැනීමට හැකි අයුරින් විදෙස් සබඳතා තර කොට ගත යුතුය.

## මිත්‍රශීලී ප්‍රතිපත්තිය

සහයෝගීතාවය වැඩිදියුණු කිරීමට සහ ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීමට ASEAN සහ පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල් සමඟ නෛතික සහ ආරක්ෂක සබඳතා ශක්තිමත් කරන්නෙමු. දැනුම, තාක්ෂණය සහ සම්පත් බෙදාගනිමින් ගෝලීය අභියෝග සාර්ථක ලෙස ජයගැනීමට මිත්‍ර පාර්ශවයන් සමඟ අපි සහයෝගීව කටයුතු කරන්නෙමු. මීට අමතරව ජාත්‍යන්තර සම්මුතීන් සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන්නෙමු.

## වෙළඳ ගිවිසුම්

ජාත්‍යන්තර වෙළඳාම හරහා අපගේ ආර්ථිකය නංවාලීමට ක්‍රියා කරමින් ශ්‍රී ලංකාවට ප්‍රයෝජනවත් වන නිදහස් වෙළඳ ගනුදෙනු පිළිබඳව විශේෂඥයින්ගේ මැදිහත් වීමෙන් සාකච්ඡා කළ යුතුය. ගිවිසුම්ගත වීම් වලදී අප මවුබිමට හෝ එහි අනාගතයට අහිතකර නොවන ලෙස මනා දැක්මකින් යුතුව විශේෂඥ උපදෙස් මත පමණක් ක්‍රියා කරන බවද සහතික කරන්නෙමු.



# ව්‍යාපාර හිතකාමී පරිසරයක් ගොඩනැගීම

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# ව්‍යාපාර හිතකාමී පරිසරයක් ගොඩනැඟීම

කිසියම් රටක සමෘද්ධිමත් ආර්ථිකයක් පවත්වාගෙන යාමට නම් ව්‍යවසායකත්වයට, නවෝත්පාදනය හා විදෙස් ආයෝජන වලට හිතකර, පරිසරයක් තිබීම අත්‍යාවශ්‍ය වේ. නව්‍ය ව්‍යාපාර ආරම්භ කිරීමේ ක්‍රියා පටිපාටීන් නිසි අධීක්ෂණයකට යටත්ව සරල කරවීම මඟින් මෙරට සිටින තරුණ, නව්‍ය ව්‍යවසායකයාගේ සිට ජාත්‍යන්තර ව්‍යාපාර ප්‍රජාව දක්වා අපේ රටේ ආර්ථික වර්ධනයේ කොටස් කරුවන් කරගත හැකිවනු ඇත. ව්‍යාපාර හිතකාමී පරිසරයක් බිහිකිරීම සඳහා, ජන බල සටන අපේ මූලික යෝජනා කිහිපයක් මෙලෙස ඉදිරිපත් කරන්නෙමු.

## ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම

- ආයෝජන සඳහා මෙරටට පැමිණෙන විදේශිකයන් වෙනුවෙන් අදාළ ලියාපදිංචි කිරීම් හා අනුමැතීන් ලබාගැනීම් ආදියෙහි ඇති සංකීර්ණතාවයන් අවම කරවීම හා විදේශයන්හී සිට අදාළ කටයුතු කරගත හැකිවන පරිදි මාර්ගගත තාක්ෂණය යොදාගැනීම.
- ආයෝජන අනුමැතීන් අඩු කාලයක් තුළ ලබාදීම.
- අනෙකුත් රටවල් වලට සාපේක්ෂව ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කරගෙන යාමට ඇති කාලගුණික, දේශගුණික හා පිහිටීම අතින් ඇති ප්‍රතිලාභ පිළිබඳව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ඇ.ඩො 100,000 හෝ ඊට වැඩි මුදලක් මෙරට ආයෝජනය කරන අය වෙනුවෙන් වසර 5-10 තෙක් බලාත්මක වන පරිදි දිගුකාලීන වීසා ලබාදීම.

## බදු සහන ලබාදීම

- මාසික ආදායම රු.500,000/= ඉක්මවන පුද්ගලයන් සඳහා පමණක් අදාළ වන පරිදි බද්දක් පැනවීම.
- අධ්‍යාපන, සෞඛ්‍යය සහ නිෂ්පාදන අංශ සඳහා වන ආයතනික බදු අඩු කිරීම සහ අනෙක් අංශ වල දැනට ක්‍රියාත්මක 12% බද්ද එලෙසම පවත්වාගෙන යාම.

## පර්යේෂණ සහ සංවර්ධන සඳහා ආයෝජනය කිරීම

- පර්යේෂණවල නියැලී සිටින සමාගම්වලට සහ අධ්‍යයන ආයතනවලට බදු සහන සහ ආයෝජනය කිරීමෙන් පර්යේෂණ සහ සංවර්ධන අංශ සවිබල ගැන්වීම. (R&D)

## ව්‍යවසායකත්වය හා නවෝත්පාදනය දිරිගැන්වීම

- බොහෝ ව්‍යවසායකයින්ට ප්‍රාග්ධනය හා ව්‍යාපාර ආරම්භ කිරීම විශාල අභියෝගයකි. නව්‍ය සහ කුඩා ව්‍යාපාර සඳහා හිතකර ණය කොන්දේසි ලබාදීමට මූල්‍ය ආයතන හරහා අරමුදල් සම්පාදන වැඩසටහන් ස්ථාපිත කිරීම.
- ව්‍යාපාර දියුණුව සඳහා අවශ්‍ය සම්පත්, උපදේශන සහ පුහුණුව සපයන ආධාරක වැඩසටහන් නිර්මාණය කිරීම.




# කාන්තාව සවිබල ගැන්වීම හා යහපැවැත්ම වැඩිදියුණු කිරීම

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# කාන්තාව සවිබල ගැන්වීම හා යහපැවැත්ම වැඩිදියුණු කිරීම

කාන්තාව සවිබල ගැන්වීම හා ඔවුන්ගේ යහපැවැත්ම, රටක සමෘද්ධිමත් සමාජයක් හා ආර්ථිකයක් ගොඩනැගීම උදෙසා බොහෝ සෙයින් වැදගත් වේ. රටක පැවැත්ම හා රටේ ආර්ථිකය කෙරෙහි සෑම කාන්තාවකගේම භූමිකාවේ වැදගත්කම වටහාගෙන, ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, සෞඛ්‍යය පහසුකම් හා ආරක්ෂාව සලසා දීම මඟින් ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහා අවස්ථාවන් උදාකරදීම ඉතා වැදගත් වේ. කාන්තාවන් වෙනුවෙන් සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමෙන් නොනැවතී ඔවුන්ට සවියක් වෙමින්, රටේ සංවර්ධනය උදෙසා යුහුසුළුව දායක වීමටත්, ඊට නායකත්වය ලබාදීමටත් හැකි වටපිටාවක් නිර්මාණය කිරීමට අපි බැඳී සිටින්නෙමු.

## කාන්තාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම

- ව්‍යවසායකත්ව සංවර්ධනය: කාන්තා ව්‍යවසායකත්වය ඔප්නැංවීම සඳහා මූල්‍ය සාක්ෂරතාවය ලබාගැනීමට අවශ්‍ය වැඩසටහන් දියත් කිරීම, ණය පහසුකම් ලබාදීම හා ව්‍යාපාර සංවර්ධන සේවාවන් වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සැලසීම.
- සේවා නියුක්තියේදී සම අවස්ථා ලබාදීම: කාන්තාවන්ට සේවා ස්ථානයේදී සමාන වැටුප් තල, සමාන අවස්ථාවන් හා නිසි අවධානය හිමි වන පරිදි ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.

## සෞඛ්‍යය හා සනීපාරක්ෂක යහපැවැත්ම

- සෞඛ්‍ය පහසුකම් සලසාදීම: කාන්තාවන් සඳහා අත්‍යාවශ්‍ය ප්‍රජනක සෞඛ්‍ය, මානසික සුවතාව ඇතුළු උසස් සෞඛ්‍ය සේවාවන්ට පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි වටපිටාවක් නිර්මාණය කිරීම.
- සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම: තත්වයෙන් උසස් සනීපාරක්ෂක නිෂ්පාදනයන් දැරිය හැකි මිල ගණන් යටතේ ලබා ගැනීමට හැකිවන පරිදි මුළු දිවයිනම ආවරණය වන් පරිදි වැඩසටහන් දියත් කිරීම.

## කාන්තා සුරක්ෂිතභාවය

- නීතිරීති සම්පාදනය: කාන්තාවට එරෙහිව සිදුකරන සියළුම ආකාරයේ හිංසනයන් පිටුදැකීමට අවශ්‍ය නීති ශක්තිමත් කිරීම හා ඒවා බලාත්මක කර නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන්: කාන්තා අයිතිවාසිකම් හා සුරක්ෂිතභාවය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා අධ්‍යාපනික වැඩසටහන් හඳුන්වාදීම.

## කාන්තා නියෝජනය හා නායකත්වය දිරිමත් කිරීම

- කාන්තා නියෝජනය: සියලු අංශ ආවරණය වන පරිදි, ඒ ඒ ආයතනවල කාන්තා නියෝජනය වැඩි කිරීම සහ නායකත්වය ලබාගැනීම සඳහා ඔවුන් දිරිමත් කිරීම.
- ප්‍රතිපත්ති සම්පාදනයට කාන්තා දායකත්වය: ප්‍රතිපත්ති සම්පාදනයේදී හා තීරණ ගැනීමේදී කාන්තා පාර්ශවයේ අදහස් හා යෝජනා ලබාගැනීම.



# දරු පරපුරේ අභිවෘද්ධිය සුරක්ෂිත කිරීම හා පෝෂණය

# දරු පරපුරේ අභිවෘද්ධිය සුරක්ෂිත කිරීම හා පෝෂණය

දරුවන් අපගේ රටේ අනාගතයයි. ඔවුන්ගේ සියළුම අවශ්‍යතා සපුරාලීම, ආරක්ෂාව සැපයීම හා මනා යහපැවැත්මක් ඇතිකිරීම අපට ඇති වගකීමක් පමණක් නොව රටේ අනාගතයට සිදු කරන උපායමාර්ගික ආයෝජනයකි. දරුවන්ට අවශ්‍ය අධ්‍යාපනය, සෞඛ්‍යය, සුරක්ෂිතභාවය හා ළමා සහභාගීත්වය වැඩිදියුණු කරන අතරතුර ඔවුන්ට අවශ්‍ය සියළුම පහසුකම් සළසා ගැනීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සකස් කිරීම හා යෝජනා ඉදිරිපත් කිරීම අපගේ අභිප්‍රායයි. අපගේ ඉලක්කය රටේ සෑම දරුවෙකුටම, හොඳ පදනමක් හා පුළුල් අවස්ථාවන් සපුරා ගතහැකි පරිදි, තමාගේ හැකියාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට අවශ්‍ය සුරක්ෂිතභාවය, සුපෝෂණය හා යහපත් වටපිටාවක් ගොඩනැගීමයි.

## ගුණාත්මක අධ්‍යාපනය

- **සමස්ත ඉගැන්වීම් පටිපාටිය:** ශාස්ත්‍රීය අධ්‍යාපනයට පමණක් සීමා නොවී නිර්මාණශීලීත්වය හා සදාචාරාත්මක සංවර්ධනය යන අංශයන් ද ආවරණය වන පරිදි සමබර ඉගැනුම් පටිපාටියක් අනුගමනය කිරීම සඳහා දිරිමත් කිරීම.
- **තාක්ෂණික සංකලනය:** ඉගෙනුම් ක්‍රියාවලියෙහි පවතින හිඩැස් පිරවීමට හැකිවන පරිදි නව තාක්ෂණය පරිශීලනයට හා ඩිජිටල් අධ්‍යාපනය ලබාගැනීමට ඇති බාධා ඉවත් කිරීම.

## සෞඛ්‍යය හා පෝෂණය

- **සෞඛ්‍ය සේවා:** දරුවන් සඳහා රෝග නිවාරණ සහ ප්‍රතිකාර කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම.
- **පෝෂණ වැඩසටහන්:** සෑම දරුවෙකු සඳහාම සමබර හා පෝෂ්‍යදායී ආහාර වේලක් ලබාගැනීමට ඇති අවස්ථාව තහවුරු වන පරිදි අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## ආරාක්ෂාව හා රැකවරණය

- **නෛතික සුරක්ෂිතභාවය:** ළමා මෙහෙකාර සේවය, අපයෝජනය හා ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කිරීම පිණිස ඇති නීතිමය තත්ත්වයන් ශක්තිමත් කිරීම.
- **ප්‍රජා අධ්‍යාපනය:** ළමා අයිතීන් සහ ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සමාජීය දැනුවත්භාවය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් වැඩසටහන් හඳුන්වාදීම.

## අදහස් ප්‍රකාශනය හා සහභාගීත්වය ඉහළ නැංවීම

- **අදහස් ප්‍රකාශ කිරීමට ඇති අවකාශය:** දරුවන්ට ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට සහ සමාජීය කටයුතුවල නිරත වීමට අවශ්‍ය වේදිකාවන් නිර්මාණ කිරීම.
- **ළමා-කේන්ද්‍රීය ප්‍රතිපත්ති:** ළමුන්ගේ විවිධ වූ අවශ්‍යතා සහ ඔවුන්ගේ අභිලාශයන් ආවරණය වන පරිදි ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.



# අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය සියලු අධ්‍යාපනික අවධීන් හරහා පුළුල්ව සංවර්ධනය විය යුතු බව අපේ විශ්වාසයයි. මෙම සංවර්ධනීය ගමන ඵලදායී කිරීමට අයවැය මඟින් ප්‍රමාණවත් ප්‍රතිපාදන සැපයීම අත්‍යවශ්‍ය වේ. මුල් ළමාවිය අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාල ය දක්වා සෑම අදියරයකම නව්‍ය වූ වෙනස්කම් සිදු කළ යුතුය. තවද, පොලී රහිත අධ්‍යාපනික ණය හරහා මූල්‍ය ආධාර සැපයීම තුළින් වැඩි පිරිසකට උසස් අධ්‍යාපන ප්‍රවේශයක් ලබාදිය හැකිය. මෙම බහුවිධ ප්‍රවේශය හුදෙක් පුද්ගල අධ්‍යාපනික දියුණුවට පමණක් නොව ජාතික සමෘද්ධිය සහ ප්‍රගතිය සඳහා අවශ්‍ය අඩිතාලම දමයි. මූලික ප්‍රතිසංස්කරණයක් ලෙස රුපියල් බිලියන 200ක් අයවැයෙන් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කිරීම සහ වාර්ෂිකව එම මුදල 10% බැගින් ඉහළ දැමීම යෝජනා ජන බල සටන අප විසින් යෝජනා කරන අතර පහතින් තවත් යෝජනා කිහිපයක් දක්වා ඇත.

## ප්‍රාථමික අධ්‍යාපනය හා මුල් ළමාවිය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම

වැඩිදියුණු කළ මුල් ළමාවිය අධ්‍යාපනයක් වෙනුවෙන් අදාළ මුල් ළමාවිය සංවර්ධන ආයතන අධීක්ෂණය සඳහා කමිටුවක් පත් කළ යුතුය. ඊට අමතරව පෙර පාසල් ගුරුවරුන්ට සහ ප්‍රාථමික අංශ වල ආචාර්යවරුන්ට නිසි පුහුණුවක් ලබාදීමත් ප්‍රාථමික විෂයමාලාවන් ප්‍රායෝගික ක්‍රියාවන්ට ප්‍රමුඛතාවය ලබා දෙමින් යාවත්කාලීන කිරීමත් අපි යෝජනා කරන්නෙමු.

## ද්විතියික අධ්‍යාපනය: ගුණාත්මක ශිෂ්‍ය ද්වාරයක් ක්‍රියාත්මක කිරීම

අධ්‍යාපනික සම්පත් වෙත ප්‍රවේශ වීම, අධ්‍යයන ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, මාර්ගෝපදේශ ලබා ගැනීම සහ සිසුන්, ගුරුවරුන් සහ උපදේශකයින් අතර සන්නිවේදනය සඳහා පහසුකම් සැලසීම සඳහා මධ්‍යගත ශිෂ්‍ය ද්වාරයක් හඳුන්වා දීම. (Student Portal)

## තෘතීයික අධ්‍යාපනය: STEM අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම

STEM විෂය මාලාවන් (විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු හා ගණිත) ප්‍රවර්ධනය කළ යුතුය. තාක්ෂණික දියුණුව සහ නවෝත්පාදනය සඳහා අවශ්‍ය කුසලතා වලින් ශ්‍රම බලකාය සන්නද්ධ කිරීම සඳහා යටිතල පහසුකම් දියුණු කළ යුතුය.

## වෘත්තීය පුහුණු වැඩසටහන්: නිපුණතා සංවර්ධනය සඳහා අවස්ථා ලබා දීම

වෙළඳ සහ තාක්ෂණික ක්ෂේත්‍රවල වෘත්තීන් සඳහා සිසුන් සූදානම් කිරීම වෙනුවෙන් ප්‍රායෝගික අත්දැකීම් ලබාදීමට වෘත්තීය පුහුණු වැඩසටහන් ලබාදිය යුතුය. බොහෝමයක් සිසුන්ට උසස් අධ්‍යාපනයේදී ඇතිවන ආර්ථික බාධාවන් අවම කිරීම සඳහා පොලී රහිත අධ්‍යාපනික ණය ලබා දීම, විවිධ පසුබිම්වල සිටින සිසුන්ට උසස් අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව හැදෑරීමට අවස්ථාව සැලසීම ඉතා වැදගත් ප්‍රතිසංස්කරණ ලෙස අපි යෝජනා කරමු.



# ශක්තිමත් සෞඛ්‍යය සේවයක් සඳහා ගුණාත්මක හා උපාය මාර්ගික ප්‍රවේශය

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# ශක්තිමත් සෞඛ්‍යය සේවයක් සඳහා උපාය මාර්ගික ප්‍රවේශය

ගෝලීය වශයෙන් ව්‍යාප්ත වූ කොවිඩ්-19 වසංගතය අපට පෙන්වා දුන්නේ ශක්තිමත් සෞඛ්‍යය සේවාවක අවශ්‍යතාවය හා වැදගත්කමයි. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමත්, සුදුසුකම් ඇති වෛද්‍ය වෘත්තිකයන් පිරිසක් බිහි කිරීමත් අප ඉදිරියේ ඇති ප්‍රබල අභියෝගයකි. එමගින් සංචාරක සෞඛ්‍යය ක්ෂේත්‍රය වැනි අංශ ප්‍රවර්ධනය කිරීම තුළින් අපේ විදේශ විනිමය උපයා ගැනීමේ ඉලක්කයද සපුරාගත හැකි වනු ඇත. ලෝක මට්ටමෙන් සිංගප්පූරුව සෞඛ්‍යය ක්ෂේත්‍රයේ ප්‍රමුඛව කටයුතු කරන අයුරින්, ශ්‍රී ලංකාව දකුණු ආසියාතික කලාපයේ සෞඛ්‍යය ප්‍රමුඛයා කිරීම අපේ අරමුණයි.

## දේශීය ඖෂධ නිෂ්පාදනය ඉහළ නැංවීම

දේශීය වශයෙන් අවශ්‍ය ඖෂධ අභ්‍යන්තරව නිෂ්පාදනය කිරීම තුළින් විශාල මුදල් ප්‍රමාණයක් රටින් ඉවතට ගලා යාම වළක්වා ගත හැකි බව නොරහසකි. නමුත් ඊට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ ශිල්පීය දැනුම සඳහා විශාල වශයෙන් මුදල් ආයෝජනය කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ හරහා අවශ්‍ය දේශීය ඖෂධ ඉලක්ක සපුරාගන්නා අතරම අතිරික්ත ඖෂධ අපනයනය කිරීම මගින් ආදායම් ඉහළ නංවාගැනීමටද හැකියාව ලැබෙනු ඇත.

## ඖෂධ ආනයන ක්‍රියාවලිය කඩිනම් කිරීම


ජාතික ඖෂධ නියාමන අධිකාරිය හරහා අනුමැතිය ලබාගෙන අත්‍යාවශ්‍ය ඖෂධ මෙරටට ගෙන්වීම සැළකිය යුතු කාලයක් ගත වන ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලිය කඩිනම් හා කාර්යක්ෂම එකක් කිරීම තුළින් වඩා යහපත් සෞඛ්‍යය සේවාවක් පවත්වාගෙන යා හැකිය.

## යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය හා සෞඛ්‍යය සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය

පුද්ගලික සෞඛ්‍යය අංශය සමඟ තරඟකාරී මට්ටමේ අද්විතීය සෞඛ්‍යය සේවාවක් ඇති කිරීම සඳහා නවීන මෙන්ම උසස් ප්‍රමිතියෙන් යුත් යටිතල පහසුකම් වෙනුවෙන් අවශ්‍ය ආයෝජනයන් කිරීම අත්‍යාවශ්‍ය වේ. තව ද පහසුකම් අඩු රාජ්‍යය හා පෞද්ගලික දෙඅංශයේම රෝහල් වලට අත්‍යාවශ්‍ය සෞඛ්‍යය උපකරණ ලබාදීම කළ යුතුය. ශ්‍රී ලංකාවට සෞඛ්‍ය සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා, අපගේ ඉහළම මට්ටමේ සෞඛ්‍ය සේවාව ඉස්මතු කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සහ යටිතල පහසුකම් වැඩිදියුණු කළ යුතුය.

## වෛද්‍ය අධ්‍යාපනය විධිමත් කිරීම

වෛද්‍ය අධ්‍යාපන ක්‍රියාවලිය කඩිනම් කිරීම හා විභාග පැවැත්වීම ක්‍රමවත් කිරීම. තවද විශාල වශයෙන් වෛද්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥයන් විදෙස්ගත්වීම අවම කරවීම සඳහා තරඟකාරී වැටුප් ලබාදීම. වෛද්‍ය අධ්‍යාපනය නිම කිරීමෙන් පසු අවම වශයෙන් වසර පහක කාලයක් මෙරට තුළ සේවය කිරීම අනිවාර්යය කිරීම.



# වරාය සහ නාවික ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා වන ප්‍රතිසංස්කරණ

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# වරාය සහ නාවික ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ප්‍රතිසංස්කරණ

අප ප්‍රතිපත්ති ප්‍රකාශය වරාය සහ නාවික ක්ෂේත්‍රයේ පවතින අභියෝගවලට විසඳුම් සෙවීමට සහ එහි විභවයන් හඳුනාගනිමින් රටේ ආර්ථිකයට ලබාදෙන දායකත්වය ඉහළ නැංවීමට පහත උපාය මාර්ගික විසඳුම් ඉදිරිපත් කරමු.

## වරාය ප්‍රශස්තකරණය

- බාහිර වරාය සේවා: වරාය සේවා කළමනාකරණය කිරීම සඳහා පෞද්ගලික සමාගම් සම්බන්ධ කරගැනීමෙන් වරාය හා සම්බන්ධ මෙහෙයුම් වඩාත් කාර්යක්ෂම කළ හැක. මීට අමතරව නව තාක්ෂණය හඳුන්වා දීම තුළින් ඵලදායිතාව වැඩි කිරීමට හැකිය.
- වරාය පර්යන්ත පෞද්ගලීකරණය කිරීම: වරාය පර්යන්ත මෙහෙයුම් පෞද්ගලික සමාගම්වලට ලබා දීමෙන් ඒවායේ ක්‍රියාකාරිත්වය වැඩි කළ හැකිය.

## කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම

ශ්‍රී ලංකාවේ වරාය කාර්යය මණ්ඩලවල සේවක අතිරික්තයක් ඇති බව නොරහසකි. අකාර්යක්ෂමතාව පිණිස හේතුවී ඇති අතිරික්ත සේවකයන් ඉවත් කිරීම තරමක් අර්බුදකාරී ක්‍රියාවක් වුවද මේ වන විට එය ජාතික අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. අකාර්යක්ෂමතාවයන් වළක්වා ගැනීම සඳහා නිරන්තර ඇගයීම් පැවැත්වීමත් කාර්ය සාධනය මත පදනම් වූ දිරිගැන්වීම් ලබාදීමත් අපි යෝජනා කරමු. මීට අමතරව සේවක වැටුප් සමාලෝචනය කිරීම මඟින් විෂමතා වලින් තොර සාධාරණ වැටුප් හඳුන්වා දිය යුතුය.

## නියාමන ප්‍රතිසංස්කරණය

- විනෝද බෝට්ටු රෙගුලාසි: විනෝද බෝට්ටු සඳහා ශ්‍රී ලංකා වරායට ඇතුළුවීමේදී සහ පිටවීමේදී දැනට අය කරනු ලබන අධික ගාස්තු, සංශෝධනය කිරීම මඟින් විදෙස් සංචාරක බෝට්ටු වැඩි වශයෙන් ආකර්ෂණය කර ගත හැක. මේ හා සමගාමීව නව ආයෝජන අවස්ථා සහ රැකියා අවස්ථා නිර්මාණය කළ හැකිය.
- සමුද්‍රීය අධිකාරියක් නිර්මාණය කිරීම: සමුද්‍රීය ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ සමුද්‍රීය ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වෙනම අධිකාරියක් පිහිටුවීම අපි යෝජනා කරමු.

## ත්‍රිකුණාමල වරාය සංවර්ධනය

ලොව විශාලතම ස්වභාවික වරායක් වන ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිතව පවතින සම්පත් හඳුනාගෙන ඒවා නිසියාකාරව කලමණාකරණය කිරීමෙන් එය කලාපීය සමුද්‍රීය කේන්ද්‍රස්ථානයක් බවට පත් කළ හැකිය.




# තිරසාර සහ කාර්යක්ෂම ප්‍රවාහන සේවයක්

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# තිරසාර සහ කාර්යක්ෂම ප්‍රවාහන සේවයක්

කාර්යක්ෂම හා තිරසාර බව ප්‍රමුඛ කොටගත් ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා දැනට පවතින පහසුකම් හා ක්‍රියාත්මක වන වැඩපිළිවෙත් අනිවාර්යයෙන්ම සංශෝධනය විය යුතුය. ඒ සඳහා අප විසින් ඉදිරිපත් කරන පහත යෝජනා උපකාරී වනු ඇති බව අපගේ විශ්වාසයයි.

## පොදු ප්‍රවාහන සේවා දියුණු කිරීම

- දැනට බහුල වශයෙන් භාවිතාවන ආකාරයේ බස්රථ වෙනුවට දියුණු රටවල භාවිතා වන ආකාරයේ, වඩාත් ආරක්ෂිත හා සුවපහසු බවින් වැඩි  බස්රථ ගෙන්වීම දිරිමත් කිරීම සඳහා අවශ්‍ය සහන ලබාදීම.
- බස් හා දුම්රිය භාවිතයෙන් ප්‍රවාහන අවශ්‍යතා සපුරාගන්නා මඟීන් ගේ පහසුව සඳහා ධාවන කාලසටහන්, ටිකට්පත් මිලදීගැනීම් ඇතුළු සේවා සජීවීව යාවත්කාලීන වන දුරකතන යෙදවුම් හා වෙබ් අඩවි වැනි තාක්ෂණික ප්‍රවේශයන් ස්ථාපිත කිරීම සඳහා පෞද්ගලික තොරතුරු තාක්ෂණ අංශයේ සහය ලබා ගැනීම.
- පාසැල් සේවා වාහනවල ප්‍රමිතිය නියාමනය කිරීම හා තදබද ඇතිවන ආකාරයෙන් අනාරක්ෂිතව සිසුන් ප්‍රවාහනය කිරීම් වැළක්වීමට අදාල ක්‍රියාමාර්ග ගැනීම.
- ත්‍රීරෝද රථ ආනයනය හා ණය ලබාදීම අධෛර්යමත් කිරීම සහ දැනට ධාවනයේ නියත වන රියදුරන් සඳහා අවශ්‍ය ආචාරධර්ම පද්ධති හා මඟී පහසුව සඳහා සාධාරණ ගෙවීම් පද්ධතියක් හඳුන්වාදීම.

## දුම්රිය ප්‍රමිතිකරණය

- දුම්රිය ප්‍රමාදයන් අවම කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා මානව සම්පත් නිසි අයුරින් කලමණාකරණ කිරීම.
- කාර්යාල වේලාවන් වල ධාවනය වන දුම්රිය ප්‍රමාණය වැඩි කිරීම හා මඟී තදබදය අවම කළහැකි වන පරිදි දුම්රිය මැදිරි ආදිය යෙදවීම.
- ඛණිජතෙල්, ගල්, වැලි සහ කැළිකසල ප්‍රවාහනය වැනි විශාල වශයෙන් වාහන භාවිතා වන අංශ සඳහා දුම්රිය භාවිතය හැකිතාක් ඉහළ නැංවීම.
- මුද්‍රණය කිරීමට වැයවන ඉහළ පිරිවැය හා පරිසරයට බැහැර කිරීමෙන් වන පරිසර හානිය පිළිබඳ සලකා බලා කඩිනමින් විද්‍යුත් ටිකට් පත් ක්‍රමවේදයක් සකස් කිරීම. මේ සඳහා පෞද්ගලික තොරතුරු තාක්ෂණ සමාගම් වල සහයෝගය ලබාගත හැකිය.

## විදුලි වාහන භාවිතය ඉහළ නැංවීම

- විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන භාවිතය දිරිමත් කිරීම සඳහා ඒවා අපනයනයේදී පනවා ඇති අධික බදු ලිහිල් කිරීම.
- දිවයිනම ආවරණය වන පරිදි සූර්ය බලය හා සුළං බලය යොදාගනිමින් වාහන බැටරි ආරෝපණ මධ්‍යස්ථාන ඇති කිරීම.



# තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය සංවර්ධනය

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය සංවර්ධනය

මේ ගෙවී යන්නේ ශ්‍රී ලංකාව තොරතුරු තාක්ෂණය සහ ඒ හා සම්බන්ධ සේවා සැපයීම අතින් ලොව පිළිගත් මධ්‍යස්ථානයක් ලෙස නැගී එන කාල පරිච්ඡේදයකි. මූල්‍ය, බැංකු, නීති හා විදුලි සංදේශ වැනි විවිධ පරාසයන් වල සේවා සපයන ව්‍යාපාර ක්‍රියාවලි කලමණාකරණ අංශය (IT-BPM) මින් කැපී පෙනෙන අංශයක් වන අතර රටේ ආර්ථික වර්ධනය සඳහා ඔවුන් දක්වන දායකත්වය අතිමහත්ය.

- 600 කට අධික ක්‍රියාකාරී IT-BPM සමාගම් ව්‍යාප්තිය
- 150,000 කට වැඩි රැකියා අවස්ථා පැවතීම
- 2022 වන විට ඩොලර් බිලියන 1.5කට ආසන්න අපනයන ආදායමක් උපයා තිබීම

මෙම ක්ෂේත්‍රයේ වැදගත්කම පෙන්වන උදාහරණ කිහිපයකි.

## තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ උප අංශ හා ආයෝජන අවස්ථා

- මෘදුකාංග සංවර්ධනය : මෘදුකාංග සහ වෙබ් අඩවි නිර්මාණය කිරීම සහ ඒවා නඩත්තු කිරීම ඇතුළු තවත් 100 කට අධික සේවා රාශියක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන තොරතුරු තාක්ෂණ සේවා ආයතන විසින් සපයනු ලබයි. HCL Technologies, CodeGen International සහ Virtusa යනු ඉන් කිහිපයකි.

- තොරතුරු තාක්ෂණ සම්බන්ධ සේවා : දැනුම සහ ව්‍යාපාර පදනම් කරගත් සේවා ( KPO සහ BPO ) යනු ගෝලීය වශයෙන් විශාල ඉල්ලුමක් ඇති ක්ෂේත්‍ර වේ. මූල්‍ය සේවා, ගනුදෙනු ආදිය කලමණාකරණය කිරීමේ සිට විශාල පරිමාණයේ ඇමතුම් මධ්‍යස්ථාන දක්වා ම මෙම ක්ෂේත්‍රයන් විහිදී පවතියි. HSBC Data Processing Lanka සහ WNS Global Services වැනි විශාල පරිමාණයේ ආයතන මෙම අංශයේ ඉතා සුප්‍රකට ආයතන කිහිපයකි.

- තොරතුරු තාක්ෂණ පුහුණු මධ්‍යස්ථාන: ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සහ ආසියා පැසිෆික් තොරතුරු තාක්ෂණ ආයතනය වැනි ආයතන ඇතුළුව තවත් තොරතුරු තාක්ෂණ පුහුණු මධ්‍යස්ථාන රාශියක් විසින්, මනා නිපුණත්වයකින් යුත් දැනුමෙන් සන්නද්ධ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් පිරිසක් බිහිකිරීමෙහිලා විශාල සහ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

## තොරතුරු තාක්ෂණ සේවා හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ ගෝලීය ස්ථාවරය

- අංග සම්පූර්ණ සේවාවන්: මෘදුකාංග සංවර්ධනය, තත්ත්ව පරීක්ෂාවන් (QA) , පරිශීලක අත්දැකීම් (UI) වැනි ක්‍රියාවලීන්ගේ විශේෂඥ දැනුම සමඟින්, ශ්‍රී ලංකාව අංග සම්පූර්ණ තොරතුරු තාක්ෂණ විසඳුම් සපයන්නෙකු ලෙස ගෝලීයව ස්ථානගත වී ඇත.

- නිපුණ ශ්‍රම බලකාය: අනුවර්තනය වීමේ හැකියාව සහ ගුණාත්මකභාවය සඳහා ප්‍රසිද්ධ මෘදුකාංග ඉංජිනේරුවන් සහ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් ශ්‍රී ලංකාව සතුව ඇත.

- සේවා සම්බන්ධතා සහ දත්ත මධ්‍යස්ථාන: ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන දත්ත මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටීම භූගෝලීය වශයෙන් සහ දේශගුණික වශයෙන් ඉතා ප්‍රයෝජනවත් වේ.

## තොරතුරු තාක්ෂණ සේවා ශක්තිමත් කිරීම සඳහා අපගේ යෝජනා

- තොරතුරු තාක්ෂණ ආයතන සහ අධ්‍යාපන ආයතන අතර සහයෝගිතාව වැඩිකිරී ම: මෙමඟින් නවීනතම තාක්ෂණය සහ තාක්ෂණික ප්‍රවණතාවයන් පිළිබඳ අවබෝධයක් ඇති අනාගත ශ්‍රම බලකායක් ගොඩනඟාගත හැකි වනු ඇත.

- නවෝත්පාදනය හා ව්‍යවසායකත්වය: නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය සඳහා පහසුකම් සැලසීම සඳහා නවීන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් දියුණු කිරීම වෙනුවෙන් අවශ්‍ය ආයෝජනයන් කළ යුතුය. ව්‍යවසායකයින්ට සහයෝගය ලබා දීම හා දිරිමත් කිරීම තුළින් නවෝත්පාදන සංස්කෘතියක් ඇති කළ හැකිය. ව්‍යවසායකයින්ට ඔවුන්ගේ අදහස් සාක්ෂාත් කර ගැනීම සඳහා අරමුදල් සැපයීම, උපදේශනය සහ අවශ්‍ය සම්පත් දායකත්වය ලබා දීම ද ඉතා වැදගත් කාර්යයකි

- මානව සංවර්ධන අංශ සංවර්ධනය: ශ්‍රම බලකාය සෑම විටම ඕනෑම ආයතනයක වටිනාම සම්පතයි. ඔවුන්ගේ කුසලතා හා දක්ෂතා වලට අනුකූලව ඒවා වැඩි දියුණු කිරීමට අවශ්‍ය ආයෝජනයන් කිරීම සැම විටම වැදගත් වේ. ගෝලීය වෙළඳපොලේ වැඩි වටිනාකමක් ඇති විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත වැනි අංශ වලට අවශ්‍ය වෘත්තිකයන් පුහුණුකිරීමේ වැඩ සටහන් ආදිය දියත් කිරීම මෙහිදී හොඳ අනාගත ආයෝජනයක් වනු ඇත.



# විදුලි සංදේශ ක්ෂේත්‍රය සවිබල ගැන්වීම

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# විදුලි සංදේශ ක්ෂේත්‍රය සවිබල ගැන්වීම

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය ප්‍රතිසංස්කරණය කිරීම ආර්ථික වර්ධනයටත්, නව්‍යකරණය තුළින් නොයෙක් ක්ෂේත්‍ර සංවර්ධනය කිරීමටත් අත්‍යවශ්‍ය සාධකයකි. ඩිජිටල්කරණය වන ලෝකය තුළ, සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා සන්නිවේදන ජාල ඉතා වැදගත් වේ. තාක්ෂණික යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමෙන්, ඩිජිටල් සාක්ෂරතාව ඉහළ නැංවීමෙන් සහ කලාපීය සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමෙන්, ශ්‍රී ලංකාව තාක්ෂණයෙන් සන්නද්ධ කළ හැකිය. මෙම ප්‍රවේශය ශ්‍රී ලාංකිකයින්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමෙන් හුදෙක් නොනැවතී ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ ඩිජිටල් යුගයේ සමෘද්ධිමත් අනාගතයක් සහතික කරමින් දේශීය තාක්ෂණික කර්මාන්තවල වර්ධනය උත්තේජනය කරනු ඇත.

## අධිවේගී අන්තර්ජාල ප්‍රවේශය පුළුල් කිරීම

ප්‍රමුඛතම අවශ්‍යතාවය විය යුත්තේ රට පුරා විහිදුණු අධිවේගී අන්තර්ජාලය සේවා දැරිය හැකි මිලගණන් යටතේ ව්‍යාප්ත කිරීමයි. ෆයිබර් ඔප්ටික් ජාල සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් ග්‍රාමීය ප්‍රදේශවල පවා වේගවත් අන්තර්ජාල සම්බන්ධතා ව්‍යාප්ත කිරීමෙන් ලෝකයට විවෘත විය යුතුය. පුද්ගලික සමාගම් සමඟ හවුල් එකගතා වලට එළඹීම මඟින් ඩිජිටල් ආර්ථිකයට ඔවුන්ගේ සහාය ලබාගත හැක. මෙය අධ්‍යාපන අංශය කෙරෙහිද සාධනීයව බලපානු ඇත.

## ඩිජිටල් සාක්ෂරතාවය සහ කුසලතා වැඩි දියුණු කිරීම

විදුලි සංදේශ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ප්‍රමාණවත් නොවේ; ඩිජිටල් සාක්ෂරතාව සහ කුසලතා වැඩි දියුණු කිරීම ද මේ හා සමගාමීව කළ යුතුය. ඩිජිටල් කුසලතා හඳුනාගෙන ඊට අවශ්‍ය පුහුණුව ලබා දීමට සහ සයිබර් අවකාශය තුළ ආරක්ෂා විය යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීම වෙනුවෙන් රටපුරා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. මෙය රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්, මාර්ගගත වේදිකා, පාසල් විෂයමාලා සහ ප්‍රායෝගික භාවිතයන් මඟින් සාක්ෂාත් කරගත හැකිය. ඩිජිටල් දැනුමෙන් ජනතාව සවිබල ගැන්වීම ඵලදායිතාව, නවෝත්පාදනය සහ ගෝලීය ආර්ථිකය තුළ අපේ දායකත්වය ඉහළ නංවනු ඇත.

## දත්ත මධ්‍යස්ථාන පිහිටුවීම

දත්ත මධ්‍යස්ථාන පිහිටුවීම ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ප්‍රතිසංස්කරණයේ තීරණාත්මක අංගයකි. මෙම මධ්‍යස්ථාන නවීන ඩිජිටල් සේවාවන්හි කොඳු නාරටිය ලෙස ක්‍රියා කරන අතර විවිධ අංශ සඳහා අත්‍යවශ්‍ය දත්ත විශාල ප්‍රමාණයක් සුරක්ෂිතව ගබඩා කිරීමට සහ සැකසීමට පහසුකම් සපයයි. ශක්තිමත් යටිතල පහසුකම්, පැහැදිලි නියාමන රාමු සහ ආයෝජන දිරිගැන්වීම් සහිත අති නවීන දත්ත මධ්‍යස්ථාන ගොඩනැගීමෙන් ශ්‍රී ලංකාවට ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සහ ඩිජිටල් සේවා සැපයීම වැඩි දියුණු කළ හැකිය. දත්ත මධ්‍යස්ථාන පිහිටුවීමට ශ්‍රී ලංකාව තුළ පවතින කාලගුණ දේශගුණ හිතකරතාවය හා නාවුක මර්ගයන්ගේ පිහිටීම ඉතා වාසිදායක වනු ඇත.



# බලශක්ති ක්ෂේත්‍රය නඟාසිටුවීම

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# බලශක්ති ක්ෂේත්‍රය නඟාසිටුවීම

ලෝකය පුරා අවධානය තිරසාර බලශක්තිය කෙරෙහි යොමු වන පසුබිමක, ශ්‍රී ලංකාව ද ඒ සඳහා විසඳුම් සෙවීමට කාලය එළඹ ඇත. වසර පුරා පවතින සූර්යාලෝකය සහිත දේශගුණය, සුළං සහ ජල සම්පත භාවිතයෙන් අපේ බලශක්ති අවශ්‍යතා තිරසාර ලෙස සපුරාගත හැකිය. තවදුරටත් ෆොසිල ඉන්ධන මත යැපීම අඩු කර, හරිතාගාර වායු විමෝචනය අඩු කිරීමට දායකත්වය ලබාදෙන අතරතුර, හරිත සංකල්පය මුල් කරගත් කර්මාන්ත කෙරෙහි අවධානය යොමු කිරීමෙන් නව රැකියා උත්පාදනය කළ හැකිය.

මෙගාවොට් 500 ක සූර්ය පැනල සහ මෙගාවොට් 50 ක බැටරි ගබඩා පද්ධති කඩිනම් සැලැස්මක් යටතේ ජාතික විදුලිබල පද්ධතියට ඒකාබද්ධ කිරීම.

ඉන්ධන මත පදනම් වූ විදුලි උත්පාදනය සඳහා වාර්ෂිකව වැය කෙරෙන ඇමෙරිකානු ඩොලර් මිලියන 800 ක් ඉතිරි කර ගැනීම සඳහා මෙගාවොට් 2000 ක සූර්ය බලාගාර පිහිටුවීමට පුද්ගලික අංශයට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

තාප බලාගාර ප්‍රධාන වශයෙන් රාත්‍රී කාලයේ ක්‍රියාත්මකව තැබීම සහ දිවා කාලයේ බලශක්ති උත්පාදනය සඳහා සූර්ය ශක්තිය භාවිතා කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.

බලශක්ති උත්පාදනයට වාර්ෂිකව ඉන්ධන සඳහා වැයවන මුදල ඩොලර් මිලියන 1,620 සිට ඩොලර් මිලියන 600 දක්වා අඩු කිරීමේ අරමුණින්, ඩීසල් බලාගාරවල වෙනුවට ගල් අඟුරු බලාගාර භාවිතා කිරීම.

COP 21 වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව තිරසාර බැඳුම්කර, හරිත බැඳුම්කර, ඔරොත්තු දීමේ බැඳුම්කර සහ නිල් බැඳුම්කර හරහා ශ්‍රී ලංකාව දේශගුණික මූල්‍යකරණ අවස්ථා සක්‍රීයව අනුගමනය කළ යුතුය. ගෝලීය හරිත බැඳුම්කර වෙළෙඳපොළ ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන 1 ඉක්මවනු ඇතැයි පුරෝකථනය කර ඇති හෙයින්, ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකාවට සැලකිය යුතු අවස්ථාවක් තිබේ. මෙම ආයෝජනයන් රටේ හරිත ආර්ථිකය නංවාලමින් පුනර්ජනනීය බලශක්තිය, තිරසාර ප්‍රවාහනය, පරිසර දූෂණය පාලනය, කාබන් විමෝචනය අවම කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා යොමු කළ හැකිය.

මීට අමතරව ජීව වායු සහ අපද්‍රව්‍ය බලශක්තිය නිපදවීම රට පුරා ව්‍යාප්ත කිරීම සහ දැනට පවතින බොරතෙල් පිරිපහදුවෙහි ධාරිතාව ඉහළ නැංවීම ද තීරණාත්මක සාධකයක් වනු ඇත. දෛනික ධාරිතාව බැරල් 100,000ක් සහිත නව පහසුකමක් ඉදිකිරීම, 51%ක හිමිකාරිත්වයක් සහිත රජයේ පාලනය සහතික කිරීම, මෙහෙයුම් නවීකරණය කිරීම සහ වර්ධනය වන බලශක්ති අවශ්‍යතා සපුරාලීම ද ජන බල සටන යෝජනා අතර වේ.



# සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය

# සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය

මෙරටට දෙවෙනි විශාලතම විදේශ විනිමය උපයන්නා සංචාරක කර්මාන්තයයි. ගෝලීය සංචාරක ව්‍යාපාරය තුළ වඩා ආකර්ෂණීය හා සාපේක්ෂව ලාභදායී ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රසිද්ධියක් උසුලයි. කෙසේ නමුත් 2019 පාස්කු ප්‍රහාරයත් ඉන් පසුව වරින් වර ඇතිවූ සිද්ධි දාමයන් හේතු කොටගෙන අප සංචාරක කර්මාන්තය නොයෙකුත් පසුබෑම් වලට මුහුණ දීමට සිදුවිය. නිරන්තරයෙන් විකාශනය වන ගෝලීය ප්‍රවණතාවයන්ට අනුගත වන අතරතුර, ශ්‍රී ලංකාව විදෙස් සංචාරකයින් සඳහා ආකර්ෂණීය සහ ආරක්ෂිත ගමනාන්තයක් වශයෙන් සහතික කිරීම සඳහා, ජන බල සටන අපි පහත යෝජනා ඉදිරිපත් කරන්නෙමු.

## සමුද්‍ර කේන්ද්‍රීය නිල් ආර්ථිකය උපයෝගී කර ගැනීම

ශ්‍රී ලංකාව වටා ඇති අතිවිශාල වෙරළබඩ කලාපය සංචාරක කර්මාන්තය අතින් ගත් කළ නිධානයක් බඳුය. අලංකාරවත් වෙරළ කළාප, රළ පැදීමේ කලාප, කොරල්පර සහ විශේෂයෙන්ම තල්මසුන් නැරඹීමේ කලාප අප රට වටා ඇති හෙයින් රටේ ආර්ථිකය ගොඩ නැඟීමේදී ඒවා ප්‍රයෝජනයට ගත හැකිය. අපගේ සමුද්‍රීය වත්කම් හඳුනාගෙන, සංචාරක යාත්‍රා සේවයේ සිට රළ පැදීම, ස්කූබා කිමිදීම වැනි ක්‍රියාකාරකම් සඳහා උනන්දුව දක්වන සංචාරකයින් ආකර්ෂණය කර ගනිමින් ඔවුන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම තුළින් විශාල විදේශ විනිමයක් ඉපැයිය හැකිය. වැඩි සංචාරකයන් ප්‍රමාණයක් පැමිණීම යනු නිතැතින්ම කුඩා පරිමාණ වෙළඳ ප්‍රජාවගේ සිට හොටෙල් ක්ෂේත්‍රය දක්වා ව්‍යාපාර අවස්ථා නිර්මාණය වීමට හේතුවකි.


## වෛද්‍ය සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය

විදෙස් සංචාරකයන් සඳහා දැරිය හැකි මිලකට, ඉහළ මට්ටමේ සෞඛ්‍ය සේවාවක් සැපයීමෙන් වෛද්‍ය සංචාරක කේන්ද්‍රස්ථානයක් ලෙසද ශ්‍රී ලංකාව පරිවර්තනය කළ හැකිය. විශේෂයෙන්ම අප සතු දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමශිල්ප සහ දේශීය ඖෂධ ප්‍රවර්ධනය කිරීමෙන් ජාත්‍යන්තර රෝගීන් මෙරටට ආකර්ෂණය කරගත හැක.

## අධ්‍යාපනික සංචාරක ව්‍යාපාරය

පිළිගත් ජාත්‍යන්තර අධ්‍යාපන ආයතනවලට මෙරට තුළ ඔවුන්ගේ අධ්‍යාපන මෙහෙයුම් කිරීමට අවශ්‍ය පහසුකම් සලසාදීම මඟින් කලාපීය අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කළ හැකිය. විශේෂයෙන්ම ඉන්දියාවේ සිට අධ්‍යාපනය හැදෑරීම සඳහා යුරෝපා හා ඇමෙරිකානු කලාපයට අධික මුදලක් වැය කරමින් ඇදීයන සිසුන් මෙරටට ආකර්ෂණය කර ගත හැකිය. එය රට රටවල් අතර බුද්ධි හුවමාරුවටත් ආර්ථික වර්ධනයටත් හේතු වනු ඇත.

ඇතැම් රටවල් නොමිලේ වීසා ලබාදීම තුළින් ඔවුන්ගේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරන බව අප සැවොම දන්නා කරුණකි. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ට හිතකර ලෙස වීසා මිල ගණන් සංශෝධනය කිරීම තුළින් වැඩි වශයෙන් සංචාරකයන් ආකර්ෂණය කරගැනීමට හැකිය.



# ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණ සුභසාධනය

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණ සුභසාධනය

ආහාර සුරක්ෂිතතාව අපගේ ජාතික යහපැවැත්මේ මූලික අවශ්‍යතාවයක් වන අතර, සෑම ශ්‍රී ලාංකිකයෙකුටම පෝෂ්‍යදායී ආහාර වේලක් ලබාගැනීමට ඇති අයිතිය වෙනුවෙන් අපි පෙනී සිටින්නෙමු. ප්‍රජාව පෝෂණය කිරීම, ගොවීන්ට සහාය වීම සහ අපගේ කෘෂිකාර්මික සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම මෙහිදී වැදගත් කොට සැලකේ. අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, අයවැය ප්‍රතිපාදන, ඉලක්කගත පෝෂණ ආධාර, අවදානමට ලක්විය හැකි කලාප කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම, සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සහ යටිතල පහසුකම් පුළුල් කිරීම අපි යෝජනා කරන්නෙමු.

අයවැය ප්‍රතිපාදන: 10% ක වාර්ෂික වැඩිවීමක් සමඟින් ආහාර සුරක්ෂිතතාවය සංවර්ධනය සඳහා අතිරේක රුපියල් බිලියන 100 ක් අයවැයෙන් වෙන් කළ යුතුය. මෙම ආයෝජනය තුළින් ඉලක්ක කරගත් පෝෂණ ආධාර සැපයීම, කෘෂිකාර්මික සංවර්ධනයට සහය වීම සහ ආහාර බෙදා හැරීමේ ජාල වැඩිදියුණු කරනු ඇත.

අපේ ගොවීන්ට සහය වීම: ආහාර සංස්කෘතියේ කොඳු නාරටිය ගොවි ජනතාවයි. ඔවුන්ට සහාය වීම සඳහා, අපි නවීන කෘෂිකාර්මික ශිල්පීය ක්‍රම, උසස් තත්ත්වයේ බීජ සහ ණය පහසුකම් සඳහා අවකාශය ලබා දෙන්නෙමු. ගොවි ඵලදායිතාව ඉහළ නැංවීමට සහ තිරසාර ගොවිතැන් පිළිවෙත්වලට අනුගත වීමට අවශ්‍ය තාක්ෂණික සහාය සහ පුහුණුව ලබාදීම සඳහා ව්‍යාප්ති සේවා ශක්තිමත් කිරීම අපේ අරමුණයි. තවද, අපි සාධාරණ මිල යාන්ත්‍රණයන් මඟින් ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීමට සහ අතරමැදියන් මත යැපීම අවම කිරීම සඳහා සෘජු වෙළෙඳපොළ සම්බන්ධතා ඇති කරන්නෙමු.

විශේෂිත පුද්ගල කණ්ඩායම් ඉලක්ක කරගත් පෝෂණ ආධාර: ළදරුවන්, නව යොවුන් වියේ ගැහැණු ළමයින්, ගැබිනි සහ කිරි දෙන මව්වරුන්, වැඩිහිටියන් සහ වතු කම්කරුවන් වැනි අවදානම් කණ්ඩායම් කෙරෙහි වැඩි අවධානය යොමු කළ යුතුය. මෙම කණ්ඩායම් මන්දපෝෂණය සඳහා පරීක්ෂා කිරීම සහ පෙර පාසල් සහ පාසල් දිවා ආහාර ලබාදීම වැනි වැඩසටහන් වැඩිදියුණු කිරීම මඟින් අපට පෝෂණ ඌනතා ඵලදායී ලෙස විසඳා ගත හැකිය.

ආහාර සුරක්ෂිතතාව සඳහා යටිතල පහසුකම්: ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සඳහා අපි ආහාර නිෂ්පාදනය සහ බෙදා හැරීම යන අංශ දෙකම වැඩිදියුණු කළ යුතුය. වාරිමාර්ග පද්ධති, ගබඩා පහසුකම් සහ ප්‍රවාහන ජාල වැනි යටිතල පහසුකම් සඳහා ආයෝජන සිදු කිරීම ඒ සඳහා අනිවාර්යය පියවර වේ. මෙම වැඩිදියුණු කිරීම් මඟින් පසු අස්වනු පාඩු අවම කර ගැනීමටත්, ආහාර කාර්යක්ෂමව වෙළෙඳපොළ වෙත ළඟා වන බවටත් සහතික වනු ඇත.

ආහාර ස්වයංපෝෂිතභාවය ප්‍රවර්ධනය කිරීම: ප්‍රධාන ඉලක්කයක් වන්නේ ආහාර ස්වයංපෝෂිතභාවය ඉහළ නැංවීමයි. ආනයනය මත යැපීම අවම කිරීම සඳහා සහ සහල්, එළවළු සහ පලතුරු වැනි ප්‍රධාන ආහාර වර්ග වගා කිරීම දිරිගැන්වීම සඳහා බෝග විවිධාංගීකරණය කිරීමට අපි ජනතාව සවිබල ගන්වන්නෙමු. අපගේ ආහාර පද්ධතිය ගෝලීය වෙළෙඳපොළ උච්චාවචනයන්ට ඔරොත්තු දෙන බව සහතික කිරීමටත් දේශීය ආහාර නිෂ්පාදනය සහ පරිභෝජනය ප්‍රවර්ධනය කිරීමටත් අවශ්‍ය ප්‍රතිපත්ති සැලසුම් කරන්නෙමු.



# කෘෂිකර්මාන්තය ශක්තිමත් කිරීම

# කෘෂිකර්මාන්තය ශක්තිමත් කිරීම

කෘෂිකර්මාන්තය අතීතයේ ශ්‍රී ලාංකේය නාමය ලොව හමුවේ ඔසවා තැබූ ක්ෂේත්‍රයකි. "පෙරදිග ධාන්‍යාගාරය" යන අන්වර්ථ නාමයෙන් එකල ශ්‍රී ලංකාව ආමන්ත්‍රණය වීමටද හේතුව එයයි. නමුත් පසුකාලීනව එම තත්ත්වය යම්කිසි පසුබෑමකට ලක්ව ඇති බව නොරහසකි. පාලනාධිකාරය විසින් කලින් කලට ගනු ලබන තීරණ කෘෂිකර්මාන්තයේ උන්නතිය හෝ අවනතිය පිළිබඳ බලපාන තීරණාත්මක සාධකයකි. අද වන විට ක්ෂේත්‍රයේ පවතින ගැටළු හා පසුබෑම් අවම කරලීම සඳහා ජන බල සටන අප විසින් පහත යෝජනා ඉදිරිපත් කරන්නෙමු.

## වාරිමාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම.

- වැව් ප්‍රතිසංස්කරණය කිරීම හා වාරි ළිං සංවර්ධනය කිරීම මඟින් ඒවායේ ජල ධාරිතාවය ඉහළ නැංවීම.
- ජල ඉතුරුම් තාක්ෂණයන් පිළිබඳ ගොවි ජනතාව දැනුවත් කිරීම තුළින් ස්ථාවර ජල සැපයුමක් සහතික කිරීම.
- වැව් හා ආශ්‍රිත පෝෂක ප්‍රදේශවල ඇති ජල දූෂක ප්‍රභව පිළිබඳ නිසි අධ්‍යනයක් සිදුකිරීම හරහා ජල දූෂණය අවම කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- කෘෂි රසායන ආදී ජලයට මෙන්ම මානව ශරීරයට පවා අහිතකර දෑ වාරි ජලයට එක්වීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම.

## කෘෂිකාර්මික නවෝත්පාදනය පුළුල් කිරීම

- පසු අස්වනු පාඩු අවම කිරීම සඳහා උපකාරී වන නවෝත්පාදන දිරිමත් කිරීම සඳහා අනුග්‍රහය ලබාදීම.
- රජය සතු ගොවිපල භාවිතය ප්‍රශස්ත කිරීම සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම උදෙසා පුද්ගලික අංශයේ සහයෝගීතාවය ලබාගැනීම.
- 25%ක් වන කෘෂිකාර්මික ශ්‍රම බලකාය සමස්ත දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය ඉහළ නැංවීමට අවශ්‍ය ඵලදායීතාව වැඩිදියුණු කිරීමට අවධානය යොමු කිරීම.

## පොහොර භාවිතය

- කාබනික පොහොර භාවිතය වැනි සංවේදී ක්‍රියාමාර්ග වලට අදාළ ශක්‍යතා අධ්‍යනයන් සිදු කිරීම.
- පොහොර සහනාධරය වැනි වැඩසටහන් නියාමනය කිරීම හා නිරන්තරයෙන් ගොවි ජනතාවගේ අදහස්, අවශ්‍යතා වලට අවධානය යොමු කිරීම.
- රසායන පොහොර වල අඩංගු සංයුතීන් පිළිබඳ නිරන්තර අහඹු පර්යේෂණ සිදුකිරීම හරහා කෘෂිකර්මාන්තය කෙරෙහි වැඩි දායකත්වයක් දක්වන රජරට ප්‍රදේශය වෙළාගත් වකුගඩු රෝග පාලනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.



# ධීවර කර්මාන්තය හා ආශ්‍රිත ජනජීවිත නඟාසිටුවීම

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# ධීවර කර්මාන්තය හා ඒ ආශ්‍රිත ජනජීවිත නඟාසිටුවීම

ශ්‍රී ලංකාව, කිලෝමීටර සිය ගණනක් දිග මුහුදු වෙරළකට මැදිව ඉන්දියන් සාගරයේ ප්‍රමුඛ නාවුක මාර්ගයන්ගේ මධ්‍යයෙහි පිහිටි දූපත් රාජ්‍යයකි. මුහුදෙන් පමණක් නොව දහස් ගණනකින් යුත් ගංගාවල් සහ පොහොසත් අතීත වාරි තාක්ෂණයෙන් බලගැන්වුණු අභ්‍යන්තර වැව්, අමුණු සහ ඇළ මාර්ග වලින් සමන්විත රාජ්‍යයකි. වෙරළාසන්න සහ ගංගා වැව් අමුණු ආශ්‍රිත ජනයාගේ ජීවනෝපාය බොහෝවිට ධීවර කර්මාන්තයයි. පවතින අඩුපාඩු අවම කරමින් ධීවර කර්මාන්තය නඟාසිටුවීම තුළින් ආශ්‍රිත ජනජීවිතය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අප විසින් පහත යෝජනා ඉදිරිපත් කරන්නෙමු.

## ඉන්දු - ශ්‍රී ලංකා ධීවර ප්‍රශ්නය

ඉන්දු - ශ්‍රී ලංකා ධීවර ප්‍රශ්නය විසඳීම සඳහා අවශ්‍ය දේශපාලනික මැදිහත් වීම් කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදීම හා ඒ ඔස්සේ තිරසාර විසඳුම් වලට එළඹීම.

## ඵලදායීතාවය ඉහළ නැංවීම

ශීතාගර, ගබඩා සහ ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කිරීම හා නව තාක්ෂණය යොදාගනිමින් මත්ස්‍ය තොග ගබඩා කිරීම හා ප්‍රවාහනය විධිමත්ව නියාමනය කිරීම මඟින් කර්මාන්තයේ ඵලදායීතාවය ඉහළ නැංවීම.

## මිරිදිය මත්ස්‍ය කර්මාන්තය

අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීමට ප්‍රාදේශීය වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා කර්මාන්තයට හිතකර උපාංග ආදිය ලබාදීම.

අභ්‍යන්තර ධීවර කර්මාන්තය දිරිමත් කිරීම වෙනුවෙන් ජලාශ වලට මත්ස්‍යයන් මුදාහැරීම වැනි අත්‍යාවශ්‍ය වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යෑම.

## විසිතුරු මත්ස්‍ය කර්මාන්තය

පවතින මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන වල ක්‍රියාකාරීත්වය නියාමනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම.

ආර්ථිකමය වශයෙන් විසිතුරු මත්ස්‍ය අපනයනයේ වැදගත්කම පිළිබඳ අධ්‍යාපනයක් ලබාදීම හා ඒ සඳහා වෙළඳපොල අවස්ථා නිර්මාණය කිරීම.



# කිරි නිෂ්පාදන කර්මාන්තය

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# කිරි නිෂ්පාදන කර්මාන්තය

කිරි නිෂ්පාදනය හුදෙක් කර්මාන්තයක් පමණක් ම නොවේ; එය බොහෝ දේශීය කිරි ගොවීන්ගේ ජීවනෝපායයි. කිරි කර්මාන්තයෙන් යැපෙන පවුල් විශාල සංඛ්‍යාවක් අප රටේ ඇත. කිරි ගවයින් ඇති කිරීමට සුදුසු දේශගුණික වටපිටාවක් සහ සාරවත් තෘණබිම් ද අප සතුව ඇත. කෙසේ වෙතත් විටින් විට පැන නැගෙන අභියෝග එහි සංවර්ධනයට බාධා පමුණුවයි. මේ බාධා මැඬලීමට කිරි ගොවීන්ට අවශ්‍ය පහසුකම් අවශ්‍ය වේලාවට ලැබෙන්නේ නම් අපට මෙම කර්මාන්තයේ සම්පූර්ණ විභවය හඳුනාගෙන කර්මාන්ත අරමුණු සාක්ෂාත් කරගත හැකි බව අපගේ විශ්වාසයයි.

මූලික අභියෝගය වන්නේ ගුණාත්මක බවින් ඉහල කිරි ලබා ගැනීමයි. මෙහි වගකීම සහ අධීක්ෂණ කාර්යභාරය ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතු වුවද, පර්යේෂණ කළමනාකරණය කරනු ලබන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසිනි. මෙම ආයතන දෙක අතර අන්‍යෝන්‍ය සහයෝගීතාවය වැඩිදියුණු කිරීමෙන් කිරි ගොවි ගැටළු වලට කඩිනම් විසඳුම් ලබාදිය හැකිය.


- දැනට සාමාන්‍යක් ලෙස කුඩා පරිමාණ කිරි ගොවීන් ස්වභාවික තත්ත්ව යටතේ කිරි ලීටර 2 - 3 අතර නිෂ්පාදනය කරනු ලබන අතර, මනා දැනුමක් හා අදාළ තාක්ෂණය ඔවුන්ට ලබාදෙන්නේ නම් මෙය දෛනිකව කිරි ලීටර 5 - 6 දක්වා ඉහළ දැමිය හැකිය.

- කිරි නිෂ්පාදනයේ අතුරුඵල වන චීස්, බටර් ආදී නිෂ්පාදන දේශීය වශයෙන් නිපදවීම කෙරෙහි අප අවධානය යොමු කළ යුතුය. මීට අමතරව කිරිපිටි වෙනුවට පිරිසිදු දියර කිරි භාවිතය ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය ප්‍රචාරණ කටයුතු කිරීම කළ යුතුය.

- ගුණාත්මකව හා ආරක්ෂිත ආකාරවලින් නිෂ්පාදන කරනු ලබන කිරි ගොවීන්ගේ ශ්‍රමයට වටිනාකමක් ලැබෙන පරිදි කිරි මිලදී ගැනීම තුළින් ඔවුන් දිරිමත් කළ යුතුය.

- කිරි ගවයින්ගේ සෞඛ්‍යය තත්ත්වය හා කිරි වල සංයුතිය පිළිබඳ අදාළ පරීක්ෂණ ආදිය පැවැත්වීමට අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් පත් කිරීම හා ග්‍රාමීය මට්ටමින් පශු වෛද්‍යවරුන් පත් කිරීම මඟින් කිරි ගොවීන් හට පැනනැඟිය හැකි ගැටළු වලට අවශ්‍ය උපදෙස් ලබා දිය යුතුය.

- දියර කිරි ගොවීන්ගෙන් මිලදීගෙන සංචිත පවත්වාගෙන යාමට අවශ්‍ය ශීතාගාර හා ප්‍රවාහන ආදී පහසුකම් වැඩිදියුණු කළ යුතුය.



# හරිතවත් ශ්‍රී ලංකාවක්

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana

# හරිතවත් ශ්‍රී ලංකාවක්

තිරසාර පරිසරයක් යනු සමෘද්ධිමත් දේශයක් නිර්මාණය කිරීමේ පදනමයි. ශ්‍රී ලංකාව දැනට පුළුල් විසඳුම් අවශ්‍ය ප්‍රධාන පාරිසරික අභියෝගවලට මුහුණ දී සිටී. පහත දැක්වෙන්නේ හරිතවත් තිරසාර දේශයක් නිර්මාණය කිරීම සඳහා වූ ජන බල සටන අපගේ ප්‍රවේශයයි.

## වන ආවරණය ඉහළ දැමීම

වගාවන් සඳහා සුදුසු ප්‍රදේශයන් හඳුනාගෙන සුදුසු පරිදි රුක් රෝපණ වැඩසටහන් ආරම්භ කිරීම. වන ආවරණය වැඩිවීමේ ඇති වාසි පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## පරිසර ආරක්ෂණ බලපත්‍ර

සියලු කර්මාන්තශාලා පාරිසරික රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බව සහතික කරමින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම අනිවාර්‍යය කිරීම හා දේශපාලන මැදිහත්වීම් වැලැක්වීම සහ සාධාරණත්වය සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

## කැලි කසල බැහැර කිරීම

- නිසි පරිද්දෙන් කැලි කසල බැහැර නොකරන පුද්ගලයින් නීතිය හමුවට පනවා ඊට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම.
- දිවයින පුරා ඇති සියලුම කර්මාන්තශාලා වල කසල හා නිෂ්පාදන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේද නිරීක්ෂණය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. කැලි කසල එකතු කිරීමේ ක්‍රමවේදය හා ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථාන වල ක්‍රියාකාරීත්වය පිළිබඳ නිරන්තර අධීක්ෂණයට ලක් කිරීම.
- අපද්‍රව්‍ය වෙන් කර කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා දැනට ක්‍රියාත්මක වන අපද්‍රව්‍ය වෙන් කිරීමේ වැඩසටහන් අධීක්ෂණය කිරීම.
- පොලිතින් සහ ප්ලාස්ටික් භාවිතය පිළිබඳ තහනම දීර්ඝ කර දැඩිව ක්‍රියාත්මක කිරීම.
- අන්තරායකර විය හැකි සායනික සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ඇතුළු විවිධ වර්ගයේ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය නීති රීති සම්පාදනය කිරීම.

## වායු දූෂණය පිටුදැකීම

- කර්මාන්තශාලා වලින් පිටවන වායු සංයුතිය හා අවශ්‍ය සම්මත නීති රීති භාවිතා කරන්නේද යන වග අධික්ෂණය කිරීම.
- කාබන් විමෝචනය අවම කිරීම පිණිස කර්මාන්තශාලා ආශ්‍රිතව සහ නාගරික පෙදෙස් වල වන වගා ඇති කිරීම.
- වාහන දුම් පරීක්ෂා කිරීම් කටයුතු නිසියාකාරව සිදුවන්නේද යන්න නියාමනයකට ලක් කිරීම.



# කර්තෘ හඳුන්වාදීම

# කර්තෘ හඳුන්වාදීම

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය අවසානයේදී, මේ වෙනුවෙන් මහත් පරිශ්‍රමයක් දරමින් සිය දූරදර්ශී චින්තනය තුළින් මෙම කාර්යය මල්ඵල ගැන්වීමට සමත් වූ සුවිශේෂී පුද්ගලයා පිළිබඳ සටහනක් තැබීම ඉතා වැදගත් වේ. ක්‍රියාශීලී ආයතනික නායකයෙකු වන ශෝන් සමරසිංහ මහතා මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ කතුවරයා ලෙස කටයුතු කළ අතර, ආර්ථික සංවර්ධනය, රාජ්‍ය පරිපාලනය සහ දේශපාලනය කෙරෙහි ඔහුගේ නොසැලෙන කැපවීම මින් මනාව පිළිබිඹු කරයි.

ශෝන් සමරසිංහ යනු මෙම ප්‍රයත්නය වෙනුවෙන් දිගු කාලයක් කැප කළ පර්යේෂකයෙකු සහ විද්වතෙකු ලෙස හැඳින්විය හැක. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය සම්පාදනයේදී නොසැලෙන අධිෂ්ඨානයකින් යුතුව, නොයෙකුත් අධ්‍යයනයන් විශාල ප්‍රමාණයක් පරිශීලනය කරමින් විවිධ වූ විෂයයන් පිළිබඳ පුළුල් ගවේෂණයක ඔහු නියැළී සිටි අතර ඒ සඳහා ඔහු දැක්වූ කැපවීම සැබැවින්ම ප්‍රශංසනීය වේ. රාජ්‍ය පරිපාලනය සහ දේශපාලන නායකත්වය කෙරෙහි ඔහු තුළ මෙතරම් උනන්දුවක් ඇති කිරීමෙහි ලා ඔහුගේ ශක්තිමත් දේශපාලන පසුබිම මහා පිටිවහලක් විය. එවන් පරිසරයක් තුළ, රාජ්‍ය පරිපාලනයෙහි ඇති සංකීර්ණතාවලට නිරාවරණය වීම, ශ්‍රී ලංකාවේ සංවර්ධනයට දායක වීමට ඔහු තුළ තිබූ උද්යෝගය තවදුරටත් තීව්‍ර කිරීමට හේතුවිය.

ශෝන් සමරසිංහ මහතා, සිය අධ්‍යාපනික ගමන ආරම්භ කළේ ශ්‍රී ලංකාවේ වඩාත් කීර්තිමත් අධ්‍යාපන ආයතනයක් වන කොළඹ බ්‍රිතාන්‍ය පාසලෙන් වන අතර එහිදී ඔහු ශාස්ත්‍රීය දක්ෂතා මෙන්ම සුවිශේෂී නායකත්ව හැකියාවන් ද ප්‍රදර්ශනය කළේය. සිය ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව, ඉන් නොනැවතී එංගලන්තයේ කැන්ටබරි හි කෙන්ට් විශ්ව විද්‍යාලයෙන් නීතිය පිළිබඳ උපාධියක් ( LLB ගෞරව) හැදෑරූ අතර එහිදී ඔහු ඉහළම සාමාර්ථ ලබාගත් සිසුන් අතර නිරන්තරයෙන් කැපී පෙනෙන චරිතයක් වෙමින් විවිධාකාරයෙන් ඇගයීමට පාත්‍ර විය.

අධ්‍යයන ජයග්‍රහණ මත පදනම්ව, ඔහු සිය වෘත්තීය ජීවිතය ආයෝජන විශ්ලේෂකයෙකු ලෙස අරඹමින්, ඉහළ වටිනාකමක් ඇති පුද්ගලයින් සහ ආයතනික ගනුදෙනුකරුවන් සමඟ නිරන්තරයෙන් කටයුතු කළේය. එයින් ලද අත්දැකීම් තුළින් ඔහු, ආයතනික මූල්‍ය කටයුතු පිළිබඳ කුසලතා ඔප්නංවා ගත් අතර, තම ගනුදෙනුකරුවන්ගේ ආයෝජන ප්‍රතිලාභ උපරිමය කරා ගෙනයෑමට අවශ්‍ය උපායමාර්ගික අවස්ථා සාර්ථකව හඳුනාගැනීමට සමත් විය.

තවද, ඔහු රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හැදෑරූ අතර එහිදී රාජ්‍ය ප්‍රතිපත්ති, ආර්ථික විද්‍යාව සහ රජයේ කටයුතු පිළිබඳ ඔහුගේ දැනුම තවත් පුළුල් කරගැනීමට සමත් විය. ඔහුගේ අධ්‍යයනවලින් වැඩි දියුණු කරගත් පර්යේෂණ සහ විශ්ලේෂණ කුසලතා යොදාගනිමින් Magna Fortuna Holdings නමින් ව්‍යාපාර උපදේශන සේවා සපයන සමූහ ව්‍යාපාරයක් ආරම්භ කළේය. විශාල ව්‍යාපාර පරාසයකින් යුත් මෙම ආයතනය නවෝත්පාදනයන් මෙහෙයවීම හා උපදේශන සේවා සැපයීම තුළින් ශ්‍රී ලංකාව වෙළඳාම සහ ආයෝජන සඳහා කලාපීය කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමට කැපවීසිටී.

මීට අමතරව Binary Technologies International, Zapmail, Commodity Trading Global Lanka ඇතුළු, අනුබද්ධිත ආයතන මෙම සමූහ ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනයක් බවට පත් කිරීමට සුවිශේෂී දායකත්වයක් ලබා දෙයි

කෙසේ වෙතත්, ශෝන් සමරසිංහ මහතාගේ අභිලාෂයන් ව්‍යාපාරික ක්ෂේත්‍රයෙන් ඔබ්බට විහිදේ. ඔහුගේ පියාගෙන් උරුම වූ දේශපාලන ආභාශය, රාජ්‍ය පරිපාලනය කෙරෙහි ඔහු තුළ වූ ඇල්ම වර්ධනය කිරීමට හේතු විය. විවිධාකාර වූ අත්දැකීම්, නිර්මාණාත්මක චින්තනය සහ නොසැලෙන වෘත්තීයභාවයෙන් සන්නද්ධ වූ ඔහු, ශ්‍රී ලංකාවේ ජන ජීවිතයට ධනාත්මක බලපෑමක් ඇති කිරීමට සූදානමින් සිටී.

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කර්තෘවරයා ලෙස ශෝන් සමරසිංහ මහතා දැක්වූ සුවිශේෂී දායකත්වය අතිශය ප්‍රශංසනීය වන අතර, ඔහුගේ කැපී පෙනෙන නායකත්වය, ආර්ථික සංවර්ධනය සඳහා නොසැලෙන කැපවීම, රාජ්‍ය පරිපාලනය සහ දේශපාලනය පිළිබඳ ගැඹුරු අවබෝධය මෙම තීරණාත්මක ක්ෂේත්‍ර පිළිබඳ අපගේ අවබෝධය තව තවත් වර්ධනය කරනු ඇති බව නොඅනුමානය.

ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana



ජන බල සටන
ஜன பல சடன
Jana Bala Satana